# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,932 — 1970 නොවැම්බර් 12 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.12**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් තැනැවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 829 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 830 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 832 |
| වෙනත් පත් කිරීම් ආදිය — — ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන — — — | 835 |
| මිළ පාලන දැන්වීම් — — — | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... — — | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා — — | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ — — | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් — — — | 851 |
| ''සුරාබද්ධ ආඥාපනත'' පිළිබඳ දැන්වීම් — — | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 370**

අංකය: ඩීජී 250/ආර්ජීසීපී/2 (II)

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 1970 ජූනි මස 1 වැනි දින සිට කපිතාන් වරුන් වශයෙන් :—

ලුතිනන් ධනපාල වීරසේකර, ල.සි.රෙ.
ලුතිනන් බන්දුසේන ජයසුන්දර, ල.සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්,

1970 නොවැම්බර් 3 දින,
කොළඹ දී ය.

11-406

**1970 අංක 371**

අංකය : ඩීඑච්/ඩීඑෆ්ජ්/30(II)

### යුද්ධ හමුදාව—ලංකා ස්වෙච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අණ දෙන නිලය දැරීමේ සේවය දීර්ඝ කිරීමත්, පදවි අත්හැරීම්, පොදු උප සේවයට මාරු කිරීම්, උසස් කිරීම් හා පත්කිරීම්

**(අ) අණදෙන නිලය දැරීමේ සේවය දීර්ඝ කිරීම**

ලංකා ස්වෙච්ඡා බලසේනා නීති රීති මාලාවේ 38 වැනි රීතිය ප්‍රකාර, 4 වන සංවර්ධන හා නිර්මාණ රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (ස්වෙච්ඡා) හි, අණ දෙන නිලධාරි ලුතිනන්-කර්නල් සිසිල් මාසල් පෙරේරා, ලං.ඉ. ගේ අණ දෙන නිලය 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළ කොට ඇත.

**(ආ) පදවි අත්හැරීම**

(I) ලුතිනන්-කර්නල් විවියන් රියල්ෂි ෂෙඩ්රික් ද සිල්වා ඉලේසිංහ, ඊ.ඩී., ලං.පා.හ., 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 2 වන (ස්වෙච්ඡා) බලඇණිය ලංකා පාබල හමුදාවේ අණ දෙන නිලධාරි පදවිය අත්හරින ලදී.

(II) ලුතිනන්-කර්නල් ජිනදාස ජෙරාල්ඩ් සමරකෝන්, ඊ.ඩී., ලං.යු.සේ.බ. 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලංකා යුද්ධ හමුදාව සේවා බලකාය (ස්වෙච්ඡා) හි අණ දෙන නිලධාරි පදවිය අත්හරින් ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පලවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවත් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. සඳහන් නිවේදනයේ සඳහන් නියමිත වේලාවෙන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි 2 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ඇ) පොදු උප සේවයට මාරු කිරීම

(I) ලුතිනන්-කර්නල් විවියන් රියල්ෂි ෂෙඩරික් ද සිල්වා ඉලේසිංහ, ඊ.ඩී., ල.පා.හ., 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරු කරන ලදී.

(II) ලුතිනන්-කර්නල් ජිනදාස ජෙරාල්ඩ් සමරකෝන්, ඊ.ඩී., ල.යු.සේ.බ. 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරු කරන ලදී.

(ඈ) උසස් කිරීම්

(I) 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලුතිනන්-කර්නල් වශයෙන් :—
මේජර් රේජිනෝල්ඩ් ලයනල් මුණසිංහ, ඊ.ඩී., ල.පා.හ.

(II) 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලුතිනන්-කර්නල් වශයෙන් :—
මේජර් ආනන්ද තෙලිකඩ පල්ලගේ, ල.යු.සේ.බ.

(ඉ) පත් කිරීම්

(I) 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 2 වන (ස්වේච්ඡා) බලඇණිය ලංකා පාබළ හමුදාවේ අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන්-කර්නල් රෙජිනෝල්ඩ් ලයනල් මුණසිංහ, ඊ.ඩී., ලං.පා.හ. පත්කර ඇත.

(II) 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට ලංකා යුද්ධ හමුද සේවා බලකාය (ස්වේච්ඡා) හි අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන්-කර්නල් ආනන්ද තෙලිකඩ පල්ලගේ, ල.යු.සේ.බ., පත්කර ඇත.

(III) 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 3 වන (ස්වේච්ඡා) බලඇණිය ලංකා සිංහ රෙජිමේන්තුවේ වැඩබලන අණදෙන නිලධාරි වශයෙන් මේජර් ආතර් ආනන්ද ද අල්විස්, ල.සි.රෙ. පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ දීය.

11–250

1970 අංක 372

අංකය : ඩීඑච්/වීඑෆ්/9/ඒ.

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

මේජර් පිච්ස්රෝයි වැලන්ටයින් පින්ටෝ ජයවර්ධන, ඊඩී, ල.යු.සේ.බ. 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බල සේනාවෙන් විශ්‍රාම ගෙන ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

11-326

1970 අංක 373

අංකය : ඩීඑච්/වීඑෆ්/22/ඒ (II).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

(අ) 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මේජර් වශයෙන්—
කපිතාන් නිහාල් පීටර් ඩොනල්ඩ් පැල්පොල, ල.සි.රෙ.

(ආ) 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට කපිතාන් වශයෙන්—
ලුතිනන් දඹදෙනි ආරච්චිගේ ජයසිංහ, ල.සි.රෙ.

(ඇ) 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට තාවකාලික කපිතාන් වරුන් වශයෙන්—
ලුතිනන් මොහමඩ් රාවුෆ් හනීපා, ල.සි.රෙ.
ලුතිනන් ඔත්මන් බර්ටි කුලසිංහ, ල.සි.රෙ.
ලුතිනන් සනත් කුමාර් වාමදේව පානබොක්ක, ල.සි.රෙ.
ලුතිනන් කලු තන්තිරි නෝමන් ද සිල්වා, ල.සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 දින,
කොළඹ දී ය.

11-325

1970 අංක 374

අංකය : ඩීඑච්/වීඑෆ්/34 (බී).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 මාර්තු මස 16 වෙනි දින සිට ලුතිනන් වශයෙන්—
දෙවන ලුතිනන් අශෝක නිහාල් රංජිත් හේවාගම, ලංජාආමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 දින,
කොළඹ දී ය.

11-327

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 375

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත :—

ඒබී. 70/70

මහාචාර්ය කේ. රාජසූරිය මහතා 1970 ඔක්තෝබර් මස 18 වැනි දින සිට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ලෙස.

ඒබී. 91/70.

බන්ධනාගාර අධිකාරි, ජී. ඒ. එස්. ඩබ්ලිව්. පෙරේරා මහතා 1970 සැප්තැම්බර් මස 23 වැනි දින සිට නැවත නියමයක් කරන තෙක්, නියෝජ්‍ය බන්ධනාගාර කොමසාරිස් මෙන් වැඩ බැලීමට.

ඒ. 32/69.

මන්නාරම දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ සහකාර ඒජන්ත ලංකා පරිපාලන සේවයේ නාගලිංගම් වේතාරනිය සෙයොන් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1970 සැප්තැම්බර් මස 18 දින සිට මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ සහකාර ධීවර අධ්‍යක්ෂ ලෙය වැඩ බැලීමට.

ඒ. 32/69.

මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ සංගරපිල්ලෙයි කතිර්කාමනාතන් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව, නැවත නියමයක් කරනතෙක් 1970 සැප්තැම්බර් මස 18 දින සිට මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 91/70.

සහකාර බන්ධනාගාර අධිකාරි, පී. ඩබ්ලිව්. පෙරේරා මහතා 1970 සැප්තැම්බර් 13 වැනි දින සිට බන්ධනාගාර අධිකාරිවරයකු වශයෙන්.

ඒබී. 85/70.

කම්කරු විනිශ්චය සභා සභාපති පී. කාරියවසම් මහතා 1970 සැප්තැම්බර් මස 9 වැනි දින සිට, කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීමට.

ඒ. 32/69.

වව්නියා පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ එන්. ඩී. ජයවීර මහතා 1970 සැප්තැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, වව්නියා පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

වව්නියා පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්ත, ලංකා පරිපාලන සේවයේ ඒ. පෙරුමයිනාර් මහතා 1970 සැප්තැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, වව්නියා පාලන දිස්ත්‍රික්කයේ අතිරේක නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒබී. 83/70.

වැඩබලන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඊ. ආර් ද ෆොන්සේකා මහතා 1970 සැප්තැම්බර් 1 දින සිට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වී. ඒ. ද ඇස්. විජේසුන්දර මහතා 1970 සැප්තැම්බර් 2 දින සිට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වශයෙන්.

ඒබී. 83/70.

රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ආර්. ඇස්. වනසුන්දර මහතා 1970 සැප්තැම්බර් මස 1 දින සිට වැඩබලන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ සී. එච්. ඇම්. පී. ප්‍රනාන්දු මහතා 1970 අගෝස්තු 5 දින සිට රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ පී. කොලින් තෝමේ මහතා 1970 සැප්තැම්බර් 1 දින සිට රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

රජයේ අධිනීතිඥ ජේ. ආර්. ඇම්. පෙරේරා මහතා 1970 සැප්තැම්බර් මස 2 දින සිට රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

රජයේ අධිනීතිඥ එච්. ඒ. ජී. ද සිල්වා මහතා 1970 සැප්තැම්බර් 1 දින රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 83/70.

වැඩබලන රජයේ අධිනීතිඥ ඇස්. කේ. සැන්ට් ඒ. පී. අමරසේකර මහතා 1970 මැයි 15 දින සිට රජයේ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ අධිනීතිඥ වී. ඇන්. වික්‍රමසිංහ මහතා 1970 ජූනි 19 දින සිට රජයේ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ අධිනීතිඥ ඇම්. ඇස්. අසීස් මහතා 1970 ජූලි 1 දින සිට රජයේ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ අධිනීතිඥ ඇස්. ඇල්. ගුණසේකර මහතා 1970 අගෝස්තු 1 දින සිට රජයේ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

වැඩබලන රජයේ අධිනීතිඥ ඇස්. කේ. එච්. විජයතිලක මහතා 1970 අගෝස්තු 5 දින සිට රජයේ අධිනීතිඥ වශයෙන්.

ඒබී. 83/70.

අධිනීතිඥ ඇම්. ඇල්. ඇම්. අමීන්, සී. දහනායක, ඩබ්ලිව්. ඇම්. ඇන්. ද අල්විස්, කේ. පී. වී. කරුණාරත්න, කේ. ඩබ්ලිව්. ඩී. පෙරේරා, ඩබ්ලිව්. ඇන්. ඩී. පෙරේරා, පී. ඇල්. සී. ප්‍රේමරත්න, ඒ. ඩී. ටී. ඇම්. පී. තෙන්නකෝන් සහ යූ. යාපා යන මහතුන් 1970 සැප්තැම්බර් මස 1 දින සිට වැඩබලන රජයේ අධිනීතිඥවරුන් වශයෙන්.

ඒබී. 83/70.

අධිනීතිඥ සී. සන්ද්‍රසේගර සහ ඇන්. කේ. ඇම්. පෙරේරා යන මහතුන් පිළිවෙලින් 1970 සැප්තැම්බර් 13 සහ 1970 සැප්තැම්බර් 21 යන දිනයන්හි සිට වැඩබලන රජයේ අධිනීතිඥවරුන් වශයෙන්.

ඒ. 72/70.

සමාජ සේවා අධ්‍යක්ෂ ඒ. ඇම්. ඇම්. සහබ්දීන් මහතා 1970 අගෝස්තු මස 14 වෙනි දින සිට දිවයිනෙන් බැහැරව සිටින කාලය, තුළදී නියෝජ්‍ය සමාජ සේවා අධ්‍යක්ෂ ලංකා පරිපාලන සේවයේ එන්. කේ. ඒ. ද සිල්වා මහතා සිය රාජකාරිවලට අමතරව සමාජ සේවා අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 59/70.

ලංකා පරිපාලන සේවයේ වී. එල්. සී. පීරිස් මහතා 1970 අගෝස්තු මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර අමාත්‍යාංශයේ ලංකා පරිපාලන සේවයේ (3 වැනි පන්තියේ) සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 61/70.

ලංකා පරිපාලන සේවයේ ජී. අමරසේන මහතා 1970 අගෝස්තු මස 8 වැනි දින සිට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ලෙස වැඩ බැලීමට.

ඒ. 59/70.

ලංකා පරිපාලන සේවයේ එම්. සෙනවිරත්න බණ්ඩා මහතා 1970 අගෝස්තු මස 6 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 31/68.

ලංකා පරිපාලන සේවයේ, එස්. ඒ. ජයවික්‍රම මහතා 1970 ජූලි මස 12 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු මාතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 36/70.

ලංකා පරිපාලන සේවයේ එම්. රාමලිංගම් මහතා 1970 ජූලි මස 12 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු. මුළු දිවයින සඳහාම නියෝජ්‍ය ආහාර කොමසාරිස්, නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂ, නියෝජ්‍ය ආහාර පාලක සහ නියෝජ්‍ය මිල පාලක (ආහාර) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 21/67.

ලංකා පරිපාලන සේවයේ එන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න මහතා 1970 ජූලි මස 5 වැනි දින සිට අ.නයන හා අපනයන පාලක ලෙස වැඩ බැලීමට.

ඒ. 7/70.

ලංකා පරිපාලන සේවයේ ඩී. ඩබ්ලිව්. ද අල්විස් මහතා 1970 ජූලි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 7/70.

ලංකා පරිපාලන සේවයේ එස්. මාරලන්ද මහතා 1970 ජූලි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 59/70.

ලංකා පරිපාලන සේවයේ එස්. ඩබ්ලිව්. කේ. ජේ. සමරනායක මහතා, 1970 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර අමාත්‍යාංශයේ (ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ) සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ කේ. වීරවර්ධන මහතා 1970 ජූලි මස 1 වෙනි දින සිට ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 40/70.

ලංකා පරිපාලන සේවයේ එම්. ටී. එල්. ප්‍රනාන්දු මහතා 1970 ජූනි මස 29 වැනි දින සිට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ලං.ප.සේ.III වැනි පන්තියේ) සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ අයි. ජේ. සීන් මහතා 1970 ජූනි මස 27 වැනි දින සිට 1970 අගෝස්තු මස 13 වැනි දින දක්වා නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු ලෙස වැඩ බැලීමට.

ඒ. 5/70.

මඩකලපුව පාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන අතිරේක දිසාපති ලංකා පරිපාලන සේවයේ කේ. ටී. ජේ. ටී. ප්‍රනාන්දු මහතා 1970 ජූනි මස 24 වන දින සිට 1970 ජූලි මස 5 වන දින දක්වා ස්වකීය රාජකාරිවලට අමතරව අම්පාර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 32/69.

පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ පී. ජී. පුංචිහේවා මහතා 1970 ජූනි මස 18 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂක ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

අම්පාර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ ආර්. බී. වීරකෝන් මහතා, 1970 ජූනි මස 18 දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව අම්පාර පාලන දිස්ත්‍රික්කය සඳහා නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයෙක් ලෙස වැඩ බැලීමට.

ඒ 7/70.

කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත, ලංකා පරිපාලන සේවයේ එස්. මාරලන්ද මහතා 1970 ජූනි මස 15 වැනි දින සිට 1970 ජූලි මස 3 වැනි දින දක්වා ස්වකීය රාජකාරිවලට අතිරේකව, මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 116/67.

ලංකා පරිපාලන සේවයේ අයි. පී. සී. මැන්දිස් මහතා 1970 ජූනි මස 1 වැනි දින සිට 1970 ජූනි මස 26 වැනි දින දක්වා ස්වකීය රාජකාරිවලට අතිරේකව ඉන්දියානු මූලෝත්පත්තියක් ඇති පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 116/67.

ආගමන හා විගමන සහකාර පාලක, ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. එච්. සී. ද සිල්වා මහතා, 1970 ජූනි මස 25 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව, ඉන්දියානු මූලෝත්පත්තියක් ඇති පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 21/67.

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලංකා පරිපාලන සේවයේ ඇස්. ජී. සමරසිංහ මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව 1970 ජූනි මස 17 වන දින සිට නැවත නියමයක් කරනතුරු රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒඩී. 26/70.

සහකාර බන්ධනාගාර අධිකාරි, සී. එම්. බර්තොලමියුස් මහතා 1970 අප්‍රේල් මස 21 වැනි දින සිට 1970 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා බන්ධනාගාර අධිකාරි තානාපතුරක වැඩ බැලීමට.

ඒ. 10/70.

ලංකා පරිපාලන සේවයේ ටී. ඩී. ජේ. විතාරණ මහතා 1970 අප්‍රේල් මස 1 දින සිට නැවත නියමයක් කරනතුරු, උපාධිධාරී සේවා යෝජන ආයතනයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ පළමුවැනි ශ්‍රේණියේ ඩබ්. ඇම්. ඇම්. බී. වීරසේකර මහතා 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුව කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

එස්. ඩී. නානායක්කාර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඹාලය,
තැපැල් පෙට්ටිය අංක 500, කොළඹ 1,
1970 නොවැම්බර් මස 5 දින දීය.

11-398

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 376**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත :—

අංකය : සීජේපී/ඒ. 6/53.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නිවාඩු පිට සිටින අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එම්. අබ්දුල් කාදර් මහතා 1970 නොවැම්බර් මස 2 වන දින සිට මාතර දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස්තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66.

එම්. එස්. එස්. කොරයා මහතා 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක් හෝ රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ රත්නපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්./ජී. 40/66.

එම්. පී. විජේසිංහ මහතා 1970 ඔක්තෝබර් මස 27 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ මන්නාරමේ සහ වවුනියාවේ දිස්ත්‍රික් නඩුකාර තැන රික්වෙස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේපී/එස්. 16/55.

ඩී. කයු. එම්. සිරිමාන මහතා 1970 ඔක්තෝබර් මස 10 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් යාපනේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/එන්. 2/53.

ඩී. පී. නිස්සංග මහතා 1970 ඔක්තෝබර් මස 10 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් මහනුවර දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1970 ඔක්තෝබර් මස 27 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

බී. ආර්. සිල්වා මහතා 1970 නොවැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66

ඒ. එස්. විජේතුංග මහතා 1970 නොවැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් හෝ කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ඩී. 21/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා 1970 නොවැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඒ. 11/48.

ඩී. විමලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 නොවැම්බර් මස 20 වැනි දින සිට කොළඹ දි. උ. අංක 10956/එල්. දරණ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 23/48.

අයි. එම්. ඉස්මයිල් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 ඔක්තෝබර් මස 30 දින සිට යාපනයේ දිස්ත්‍රික් උසාවියේ අංක විවිධ 1284, විවිධ 1347, එල්. 2008, එල්. 2982, එල්. 2985, එල්. 3102, එල්. 3336, පී. 981 සහ පී. 2016 දරණ නඩු අසා නිමකර තීන්දු දීම පිණිස යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 6/48.

එල්. එච්. ද අල්විස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 ඔක්තෝබර් මස 19 දින සිට බලපිටිය දිස්ත්‍රික් උසාවියේ අංක එන්පී. 1812 සහ එම්. 1539 දරණ නඩුවල තීන්දු දීම පිණිස බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 49/64.

සී. එම්. තුර්මලිංගම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 ඔක්තෝබර් මස 24 දින සිට පේදුරුතුඩුව දි. උ. අංක 7916 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ්. 34/48

ඒ. සිවානන්දන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 ඔක්තෝබර් මස 30 දින සිට කෑගල්ලේ ඉල්ලීම් උසාවියේ අංක 229/සීඑච්.ඒ දරණ නඩුවේ තීන්දුව දීම පිණිස කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/වී. 1/53

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 ඔක්තෝබර් මස 13 දින සිට 17 දින දක්වා යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 30/66

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. සේරසිංහ මහතා 1970 ඔක්තෝබර් මස 13 දින සිට 18 දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/63

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. මනවරාජා මහතා 1970 ඔක්තෝබර් මස 2 සහ 5 දිනයන්හි ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/63

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ඒ. පී. තුරෙයිනායගම් මහතා 1970 ඔක්තෝබර් මස 3 සහ 4 දිනයන්හි ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/63

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඕ. එල්. එම්. ඉස්මයිල් මහතා 1970 ඔක්තෝබර් මස 6 දින සිට 9 දින දක්වා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්./ජේ. 11/61

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ඊ. පෙරේරා මහතා 1970 ඔක්තෝබර් මස 11 දින ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 31/65

ඩී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. එස්. ඒ. පෙරේරා මහතා 1970 ඔක්තෝබර් මස 4 දින සිට 6 දින සහ 28 දින සිට 31 දින දක්වා කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභා සීමාව තුළ කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 6/53

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු තිස්ස ගුණරත්න මහතා 1970 ඔක්තෝබර් මස 24 දින සිට 30 දින දක්වා පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. සෙන්ට් ඊ. අමරසිංහ මහතා 1970 ඔක්තෝබර් මස 5 දින සිට 8 දින දක්වා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 14/67

ඩබ්ලිව්. ජී. එන්. වීරරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු වී. යූ. ප්‍රනාන්දු මහතා 1970 ඔක්තෝබර් මස 3 දින කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්./එස්. 9/63

එම්. ෂන්මුගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. විජයරත්නම් මහතා 1970 ඔක්තෝබර් මස 9 දින සිට 11 දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 29/63

එම්. ෂන්මුගලිංජම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. සී. රාජරත්නම් මහතා 1970 ඔක්තෝබර් මස 31 දින සිට නොවැම්බර් මස 2 දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන. අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන තැන සහ හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 ඔක්තෝබර් මස 25 දින සිට 31 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. තියාගරාජා මහතා 1970 ඔක්තෝබ° මස 27 දින සිට 31 දින දක්වා මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 24/62

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. කනගරත්නම් මහතා 1970 ඔක්තෝබර් මස 13 දින සිට 17 දින දක්වා යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එන්. 6/67

ආර්. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සිසිල් ඊ. පෙරේරා මහතා 1970 ඔක්තොබර් 9 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66

එන්. බී. සී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ඩී. පෙරේරා මහතා 1970 ඔක්තෝබර් මස 15 දින සිට 18 දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 32/66

එස්. සෝමසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන කරන තුරු සිසිල් ඊ. පෙරේරා මහතා කොළඹ කොටුවේ පිහිටි ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 19/57

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. සූරවීර මහතා 1970 ඔක්තෝබර් මස 23 සහ 24 දිනයන්හි කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 ඔක්තෝබර් මස 21 දින සහ 26 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 10/63

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එම්. විජේසූරිය මහතා 1970 ඔක්තෝබර් මස 10, 11 සහ 12 දිනයන්හි කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 7/57

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. අබුතහිර් මහතා 1970 ඔක්තෝබර් මස 17 දින සිට 23 දින දක්වා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 17/69

එම්. පී. විජේසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. මහදිවුල්වැව මහතා 1970 ඔක්තෝබර් මස 13 දින අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එල්. 4/61

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1970 ඔක්තෝබර් මස 28 දින අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 17/55

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සිවගුරුනාදන් මහතා 1970 ඔක්තෝබර් මස 13 සහ 15 දිනයන්හි කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 1[illegible]/58

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ටී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1970 ඔක්තෝබර් මස 30 දින සිට 1970 නොවැම්බර් මස 1 දින දක්වා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 36/70

ඒ. සිවනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. රත්නසිංහම් මහතා 1970 ඔක්තෝබර් මස 28 දින සිට 1970 නොවැම්බර් මස 1 දින දක්වා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 21/58

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. සී. ටී. වී. කරුණාරත්න මහතා 1970 ඔක්තෝබර් මස 9 දින මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 27/64

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සීමම්පිල්ලේ මහතා 1970 ඔක්තෝබර් මස 22 දින සිට 26 දින දක්වා මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 9/67

එල්. එස්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඊ. සෙනෙවිරත්න මහතා 1970 ඔක්තෝබර් මස 13 දින රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 5/49

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඕ. එම්. තාහිර් මහතා 1970 ඔක්තෝබර් මස 10 දින සිට 13 දින දක්වා කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එන්. 2/57

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සීමම්පිල්ලේ මහතා 1970 ඔක්තෝබර් මස 18 වැනි දින සිට 23 දින දක්වා මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එජ්. 1/58

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ජී. දිසානායක මහත්මිය 1970 ඔක්තෝබර් මස 8 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ සහ කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එච්. කාරියප්පර් මහතා 1970 ඔක්තෝබර් මස 6, 8, 9 සහ 10 වැනි දිනයන්හි කල්මුනේ දිස්ත්‍රික්කයේ සාතම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 11/63

ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඩී. ප්‍රනාන්දු මහතා 1970 සැප්තැම්බර් මස 10 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 11/63

ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ඒ. ඕ. ද සිල්වා මහතා 1970 සැප්තැම්බර් මස 9 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/57

ආර්. ආර්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඇන්. සී. රාජපක්ෂ මහතා 1970 ඔක්තෝබර් මස 18, 20, 21 සහ 23 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගොමුව නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 10/63

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සිරිමල් ඒ. ඊ. පින්තු මහතා 1970 ඔක්තෝබර් මස 11 වැනි දින සහ 12 වැනි දින හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සිමම්පිල්ලේ මහතා 1970 ඔක්තෝබර් මස 19, 20, සහ 21 වැනි දිනයන්හි මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

එල්. සමරතුංග,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන ලේකම්.

1970 නොවැම්බර් මස 2 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී.
11-410

---

# ආණ්ඩුවේ නිවේදන

## මහනුවර ජාතික කෞතුකාගාර උපදේශක කමිටුව

1942 අංක 31 දරණ ජාතික කෞතුකාගාර ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ පහත නම් සඳහන් අය 1970.8.30 දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා මහනුවර ජාතික කෞතුකාගාර උපදේශක කමිටුවේ සාමාජිකයින් වශයෙන් සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිතුමන් විසින් පත්කරනු ලැබ සිටිති :—

1. ආණ්ඩුවේ දිසාපති, මහනුවර.
2. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, මහනුවර.
3. පූජ්‍ය පණ්ඩිත හාල්යාලේ සුමනතිස්ස හිමිපාණෝ, අස්ගිරිය පිරිවෙන, අස්ගිරිය, මහනුවර.
4. අනුරුද්ධ රත්වත්තේ මහතා, අංක 90, අනිවත්ත, මහනුවර.
5. ජී. බී. ද සිල්වා මහතා, නීතිඥ, මහනුවර.
6. වෛද්‍යාචාර්ය, ආනන්ද ජයතිලක මහතා, මහාචාර්ය, වෛද්‍ය විද්‍යා අංශය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
7. ජෝර්ජ් කීට් මහතා, සිරිමල්වත්ත, ගුන්නැපාන.

නිශ්ශංක විජේරත්න,
සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස
කොළඹ 7,
බෞද්ධාලෝක මාවතේ පිහිටි,
සංස්කෘතික අමාත්‍යාංශයේදීය.
11-274

---

එල්. ඩී. බී. 45/45. ED 26/021.

## කෘෂිකාර්මික සහ කාර්මික ණයදෙන නීතිගත සංස්ථා ආඥාපනත

මෙහි පහත දක්වෙන ව්‍යවස්ථා ලංකා කෘෂිකාර්මික සහ කාර්මික ණයදෙන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (402 වැනි අධිකාරය වන) කෘෂිකාර්මික සහ කාර්මික ණයදෙන නීතිගත සංස්ථා ආඥාපනතේ 86 (1) (ඔ) දරන වගන්තිය යටතේ සම්පාදනය කරන ලදුව, එම වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ඔක්තෝබර් 23 වන දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථා

1. මෙම ව්‍යවස්ථා 1970 (සේවක) නිවාස ණය යෝජනා ක්‍රමය ලෙස හැඳින්විය හැකිය.

2. මෙම සංස්ථාවේ සේවකයකුට තමාගේම පදිංචිය සඳහා ගෙයක් සෑදීමට ඉඩමක් මිලට ගැනීමට හෝ ගෙයක් මිලට ගැනීමට හෝ ගෙයක් තැනීමට හෝ ඉඩමක් මිලට ගැනීම සහ ගෙයක් තැනීම යන මේ කාරණා දෙකටම හෝ මෙම ව්‍යවස්ථාවලට අනුව ණයක් දීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පුළුවන.

3. සේවයේ ස්ථිර කරන ලද්දවුද, අවුරුදු පහකට නොඅඩු කාලයක නොකඩ සේවයක් ඇත්තාවූද, තමාගේ නමින් හෝ තම භාර්යාවගේ නමින් හෝ කොළඹ සිට සැතපුම් 25 ක අරයක් ඇතුළත පිහිටි ගෙයක් අයත් නොවන්නාවූද, මෙම සංස්ථාවේ සෑම සේවකයකුටම මෙම ක්‍රමය යටතේ ණය මුදලක් ඉල්ලීමට සුදුසුකම් ඇත.

4. (1) මෙම ක්‍රමය යටතේ සේවකයකුට දෙනු ලබන කිසිම ණය මුදලක්, එම නිලධාරියාගෙන් අර්ථ සාධක අරමුදලට සහ මෙම සංස්ථාවට අය විය යුතුව ඇති යම් ණය මුදලක් ඉතිරි කොටස අඩු කරගත් විට ඉතිරි වන, එම සේවකයාගේ අවුරුදු තුනක වැටුප හෝ එම සේවකයා නමට අර්ථ සාධක අරමුදලේ ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය යන මේ දෙකෙන් වැඩි මුදලට නොවැඩි විය යුතුය.

(2) මෙම ක්‍රමය යටතේ කිසිම සේවකයකුට එක ණයකට වැඩියෙන් නොදිය යුතුය.

5. (1) ණයට දෙනු ලැබූ මුළු මුදලම එය දෙනු ලැබූ කාරණය සඳහා යෙදවිය යුතු අතර, එයින් යම් මුදලක් ඉතුරු වුවහොත් එය සංස්ථාවට ආපසු ගෙවිය යුතුය.

(2) ණය මුදලකින් කිසිම කොටසක් එම ණය මුදල දෙනු ලැබූ කාරණය හැර වෙනත් කාරණයක් සඳහා නොයෙදවිය යුතුය.

(3) ගෙයක් සෑදීම සඳහා ඉඩමක් ගැනීමට හෝ ගෙයක් මිලට ගැනීමට හෝ ඉඩමක් මිලට ගැනීම සහ ගෙයක් තැනීම යන දෙකටම හෝ ණයක් දුන් විට එහි අයිතිය පිළිබඳව ප්‍රාරම්භ පරීක්ෂණයක් කිරීම සඳහාත්, නොතාරිස් ගාස්තු, මුද්දර ගාස්තු, පිටපත් කිරීමේ ගාස්තු සහ සෙවුම් ගාස්තු වශයෙනුත්, එම මිලට ගැනීම සම්බන්ධයෙන් දරන්නට සිදු වන වියදම්, එම ඉඩම හෝ ගෙය මිලට ගැනීම සඳහා යෙදවූ මුදල් ලෙස සැලකිය යුතුය.

6. (1) (අ) ණය මුදල් ඉල්ලා ඇත්තේ ගෙයක් මිලට ගැනීමට හෝ ගෙයක් තැනීමට ඉඩමක් මිලට ගැනීමට නම්, මිලට ගැනීමට බලාපොරොත්තු වන ගෙය වාසය කිරීමට සුදුසු වූවක් බවට හෝ එම ඉඩම ගෙයක් සෑදීමට සුදුසු වූවක් බවටත්, එය, ඉල්ලා ඇති ණය මුදලේ වටිනාකමට නොඅඩු වටිනාකමකින් යුක්ත බවටත් ;

(ආ) ණය මුදල ඉල්ලා ඇත්තේ ඉඩමක් මිලට ගෙන ගෙයක් සෑදීමට නම්, මිලට ගැනීමට බලාපොරොත්තු වන ඉඩම ගෙයක් සෑදීමට සුදුසු වූවක් බවටත්, ගෙය සෑදූ විට එම ඉඩම සහ ගෙය යන දෙකේම මුළු වටිනාකම ඉල්ලා ඇති ණය මුදලට නොඅඩු බවටත් ; සහ

(ඇ) ණය මුදල ඉල්ලා ඇත්තේ ගෙයක් සෑදීමට නම් එම සේවකයා ගෙය සෑදීමට බලාපොරොත්තු වන ඉඩම ඒ සඳහා සුදුසු වූවක් බවටත්, එම සේවකයා හෝ ඔහුගේ භාර්යාව හෝ ළමයින් එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිකරුවන් බවටත්, ගෙය සෑදූ විට, ගෙය සහිත ඉඩමේ මුළු වටිනාකම ණය මුදලේ වටිනාකමට අඩු නොවන බවටත්,

සාමාන්‍යාධිකාරී සෑහීමට පත්වන තුරු මණ්ඩලය විසින් කිසිම ණය මුදලක් නොදිය යුතුය.

(2) ඉහත කී අවශ්‍යතාවන් කිසිවක් පිළිබඳව තමා සෑහීමට පත්වීම සඳහා ගෙය සාදන ඉඩම හෝ ගෙය හෝ පරීක්ෂා කිරීම සඳහා තමා නියෝජනය කිරීමට සංස්ථාවේ නිලධරයකු පත් කිරීමට සාමාන්‍යාධිකාරීට පුළුවන. අවශ්‍ය නම්, සේවකයාගේ වියදමින්, හිමිකම පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට ද, ඔහුට පුළුවන.

(3) (1) වැනි ඡේදයේ සඳහන් කාර්යයක් සඳහා සේවකයකුට දෙනු ලබන සෑම ණය මුදලක්ම, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි, අවසාන ණය මුදල් කොටස ගෙවීමෙන් පසු ආරම්භ වන විසි වර්ෂය ඉකුත් නොවන කාල පරිච්ඡේදයක් තුළ දී සමාන මාසික වාරික මගින් ඊට අයත් පොළිය ද සමග සංස්ථාවට ගෙවිය යුතු ය.

එසේ වුව ද, අවසාන ණය මුදල් කොටස දෙනු ලැබූ අවස්ථාව දක්වා සේවකයාට දෙන ලද එක් එක් ණය මුදල් කොටස සඳහා අය විය යුතු පොළිය ඒ එක් එක් ණය මුදල් කොටස දෙනු ලැබීමෙන් එක් මසක් ඉකුත් වූ දින සිට සංස්ථාවට ගෙවිය යුතු ය.

තවද එසේ වුව ද, එවැනි යම් ණයක් සහ ඊට අයත් වන පොළිය ආපසු ගෙවීමට දෙනු ලබන කාල පරිච්ඡේදය, සේවකයා එම ණය ඉල්ලා අයදුම් පත ඉදිරිපත් කළ දිනට ඉක්බිතිව ම එළඹෙන ඔහුගේ උපන් දිනට ඔහුගේ වයසත් අවුරුදු හැටත් යන දෙක අතර වෙනස නොඉක්ම වූ කාල පරිච්ඡේදයක් විය යුතු ය.

7. (1) ගෙයක් තැනීමට, ගෙයක් තැනීම සඳහා ඉඩමක් මිලට ගැනීමට හා ගෙයක් තැනීමට ණය මුදලක් ඉල්ලීමේදී—

(අ) එම නිවාසය ඉදි කිරීම සඳහා වැය වන මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් සේවකයා විසින් තමාගේ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය ; සහ

(ආ) ගෙය සාදන ඉඩමේ මිනින්දෝරු සැලැස්මක්, අවශ්‍ය ද්‍රව්‍ය පිළිබඳ පරිමාණ පත්‍රයක් සහ ගෙය සෑදීමට අවසර දෙන ප්‍රාදේශීය බල මණ්ඩලයෙන් නිකුත් කෙරුණු අවසර පත්‍රය, නියම කළ විට ඉදිරිපත් කළ යුතුය.

(2) ගෙයක් සෑදීමට හෝ ඉඩමක් මිලට ගෙන එහි ගෙයක් සෑදීමට දෙනු ලබන යම් ණය මුදල් ප්‍රමාණයක් සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරන පරිදි, සංස්ථාවේ නිලධාරීන් හෝ නියෝජිතයන් හෝ විසින් කරනු ලබන පරීක්ෂණයකින් පසු, පහත සඳහන් අයුරු, කොටස් එකක් හෝ කීපයක් වශයෙන් ගෙවීමට පුළුවන :—

පළමුවන කොටස—උකස්කරය ලියා අත්සන් කොට ලියාපදිංචි කළ විට ;

දෙවන කොටස—අත්තිවාරම දිය සීරාවරණය දක්වා තැනූ විට ;

තුන්වන කොටස—වහළ උසට බිත්ති බැන්ද විට ;

හතරවන කොටස—වහලේ වැඩ නිමකොට, ගින්නෙන් ආරක්ෂා කිරීමේ රක්ෂණ සහතිකය ඉදිරිපත් කළ විට ;

පස්වන කොටස—මුළු ගෙයම සතුටුදායක අන්දමින් නිම කළ විට.

8. මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය මුදලක් සේවකයකුට ගෙවීමට පෙර, පහත සඳහන් ලියවිලිවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් නොතාරිස් කෙනෙකු ලවා ලියවා අත්සන් කරන ලෙස එම සේවකයාට නියම කිරීමට සිය අභිමතය පරිදි මණ්ඩලයට පුළුවන :—

(අ) ණය ගිවිසුමක්.

(ආ) සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරන ලද ඇපකරුවකු ඇති ඇපකරයක්.

(ඇ) සේවකයාගේ නමට ගෙන ඇති වලංගු ජීවිත රක්ෂණ සහතිකයක් සංස්ථාවේ නමට පැවරීම.

(ඈ) සංස්ථාවේ නමට ලියන ලද වෙනස් කළ නොහැකි ඇටෝර්නි බලය පැවරීමේ ලිපියක්.

(ඉ) නිදහස් අයිතිය ඇති ඉඩමක් වෙනුවෙන් විධිමත් ලෙස ලියාපදිංචි කරන ලද වලංගු උගස්කරයක්.

එසේ වුවද, සේවකයකුට ණය මුදලක් දෙනු ලබන්නේ අර්ථ සාධක අරමුදලේ ඔහු නමට ඇති මුදල ඇප වශයෙන් තබාගෙන නම්, එම මුදලට සංස්ථාවෙන් දායකවුණු කොටසේ අයිතිය අත්හරින බවට ලියවිල්ලක් ඔහු අත්සන් කළහොත් ඉහත සඳහන් කිසිදු ලේඛනයක් ලියා අත්සන් කිරීමට ඔහුට නියම නොකළ යුතුය.

9. යම් සේවකයකුට ණය මුදලක් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වූ පසු, එම මුදල, එය දෙනු ලැබූ කාරණය සඳහාම යෙදූ බවට සාමාන්‍යාධිකාරී සෑහීමට පත්වන පරිදි සාක්ෂි ඔහු විසින් පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතුය :—

(අ) එම ණය මුදල දෙනු ලැබුවේ ගෙයක් හෝ ඉඩමක් මිලට ගැනීමට නම්, ණය මුදල ලබා ගෙන මාසයක් ඇතුළත ; සහ

(ආ) එම ණය මුදල දෙන ලද්දේ ගෙයක් සෑදීමට හෝ ඉඩමක් මිලට ගෙන ගෙයක් සෑදීමට නම්, ඒ ණය මුදල දුන් දින සිට එක් වර්ෂයක් ඇතුළත.

10. ණය මුදලින් මිලට ගනු ලැබූ ඉඩම හෝ ගෙය හෝ, ණය මුදලින් තැනූ ගෙය සහ එය ඉදිකර ඇති ඉඩම හෝ, ණය මුදලින් මිලට ගත් ඉඩම සහ ණය මුදලින් තැනූ ගෙය, මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව අන්සතු කිරීම හෝ එහි අයිතිය අවහිර කිරීම නො කළ යුතු අතර, ණය මුදල් සම්පූර්ණයෙන් පියවා නිම කරන තෙක් එවැනි යම් ඉඩමකට අදාල ඔප්පු සහ සැලැස්මවල් සංස්ථා වෙහි තැන්පත් කර තැබිය යුතු ය.

11. මණ්ඩලය විසින් නියම කරනු ලබන විටක, මෙම ව්‍යවස්ථා යටතේ ණයක් දෙනු ලැබූ සේවකයකු විසින්, අවස්ථෝචිත පරිදි, ඒ ණය මුදලින් මිලට ගත් ඉඩම හෝ ගෙය හෝ ඒ ණය මුදලින් තැනූ ගෙය හෝ ඒ ණය මුදලින් මිලට ගත් ඉඩම හා එහි තැනූ ගෙය, ණය මුදල හා ඊට අයත් පොළිය ආපසු ගෙවා අවසන් කරන තෙක්, මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි ගණනකට වර්ෂයක් පාසා ගින්නෙන් විය හැකි අලාභ සඳහා රක්ෂණය කළ යුතු ය.

12. සෑම ණය මුදල් සඳහා වූ පොළිය වරින් වර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකට අනුව ගෙවිය යුතු ය.

එසේ වුව ද, එම පොළිය තත් කාලයේදී රජයේ සේවකයින්ට වැටුප් මත දෙනු ලබන ණය මුදල් සඳහා අය කළ යුතු පොළියට අඩු නොවිය යුතු ය.

තව ද, එසේ වුව ද, යම් පොළී ප්‍රමාණයක් යටතේ කලින් දෙන ලද යම් ණය මුදලකට, ඊට පසුව පොළී ප්‍රමාණය වෙනස් කිරීමක් බල නොපෑ යුතු ය.

13. ගෙයක් තැනීම සඳහා ඉඩමක් හෝ ගෙයක් හෝ මිළදී ගැනීමට සේවකයකුට දෙනු ලබන සෑම ණය මුදල්ම, මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, ණය මුදලේ අවසාන කොටස ඔහුට ගෙවීමෙන් පසු ආරම්භ වන විසි වර්ෂය ඉකුත් නොවන කාල පරිච්ඡේදයක් තුළදී, සමාන මාසික වාරික මගින්, ඊට අයත් පොළිය ද සමග සංස්ථාවට ගෙවිය යුතු ය.

එසේ වුව ද, සේවකයකුට දෙන ලද ණය මුදලක් සහ ඊට අයත් වන පොළිය ආපසු ගෙවීමට දෙනු ලබන කාල පරිච්ඡේදය, සේවකයා විසින් ඒ ණය මුදල ඉල්ලා අයදුම්පත ඉදිරිපත් කළ දිනට ඉක්බිතිවම එළඹෙන ඔහුගේ උපන් දිනට ඔහුගේ වයසත් අවුරුදු හැටත් යන දෙක අතර වෙනස නොඉක්මවූ කාල පරිච්ඡේදයක් විය යුතු ය.

14. පොළියේ යම් වාර මුදලක් හෝ ණය මුදල ආපසු ගෙවීමේ යම් වාර මුදලක් හෝ යම් සේවකයකුගෙන් සංස්ථාවට අය විය යුතු විට එකී සේවකයාගේ වැටුපින් මාසික අඩු කර ගැනීම් වශයෙන් එම මුදල් මෙම ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව, සංස්ථාව විසින් ඔහුගේ වැටුපින් කපා ගත යුතු අතර, එවැනි අඩුකර ගැනීම් සඳහා නැවත වෙනස් කළ නොහැකි ලෙස සංස්ථාව වෙත බලය පවරන ලද ලිපියක් ණය මුදලක් ලබාගත් සෑම සේවකයකු විසින් සංස්ථාවට දිය යුතු ය.

15. ණය මුදල සහ එහි පොළිය ගෙවීමට පෙර සේවකයකු සේවයෙන් අස් වුවහොත් හෝ විශ්‍රාම ගතහොත් හෝ ඔහුගේ සේවය කෙළවර කරන ලදහොත් හෝ ඔහුගේ ණය මුදලින් අය විය යුතුව ඇති ඉතිරි මුදල සහ ඊට එකතු වී ඇති පොළිය, එවකට ඔහුගේ නමට අර්ථසාධක අරමුදලේ ඉතිරිව ඇති මුදලින් අය කර ගත යුතුය.

16. සේවයේ නියුක්තව සිටින අතර යම් සේවකයකු මරණයට පත් වුවහොත් ඔහු විසින් ණය මුදලෙන් ගෙවීමට ඉතිරිව ඇති කොටස සහ එහි පොළිය, පළමුකොට, සංස්ථාවේ ව්‍යවස්ථා යටතේ මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන මරණ පාරිතෝෂිකයෙන් සහ ඔහුට අර්ථසාධක අරමුදලින් අය විය යුතු මුදලින් අය කර ගත යුතු ය.

17. මෙම ව්‍යවස්ථාවන් යටතේ දෙනු ලැබූ ණය මුදලකින් මිලට ගත් ඉඩමේ හෝ ගෙයි හෝ ණය මුදලින් තනනු ලැබූ ගෙයි හෝ ණය මුදලින් මිළට ගත් ඉඩමේ තනනු ලැබූ ගෙයි හෝ තත්ත්වය කෙසේ දැයි දැන ගැනීම සඳහා ණය මුදලින් යම් ප්‍රමාණයක් ආපසු ගෙවීමට ඉතිරිව තිබෙන කාලය තුළ කවර අවස්ථාවකදී වුවද මණ්ඩලය විසින් එම ගෙය හෝ ඉඩම පරීක්ෂා කිරීම හෝ කරවීම නිත්‍යානුකූල විය යුතුය.

18. මෙම ව්‍යවස්ථාවල—

"වැටුප" යන්නෙන්, දීමට අදහස් කරන ණය මුදල් ප්‍රමාණය ගණන් බැලීමේ කාර්යය සඳහා වන විට, සේවකයකුගේ මූලික වැටුප සහ ජීවන දීමනා අදහස් වේ ;

"මණ්ඩලය" යන්නෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ ; සහ

"සංස්ථාව" යන්නෙන් ලංකා කෘෂිකාර්මික සහ කාර්මික ණයදෙන සංස්ථාව අදහස් වේ.

ඇල්. ඩී.—බී. 104/44.

## භාර ආඥපනත

(87 වැනි අධිකාරය වන) භාර ආඥපනතේ 20 (එ) වැනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිවරයා විසින් පනවනු ලැබූ රීතිය.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 ඔක්තෝබර් 27 දින.
කොළඹ දී ය.

### රීතිය

1954 නොවැම්බර් 26 වැනි දින අංක 10,738 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1954 ජාතික නිවාස (අංක 2) නියෝග යටතේ නිකුත් කරන ලද සෘණ පත්‍ර, මුදල්වලින් සමන්විත භාර දේපළ (87 වැනි අධිකාරය වන) භාර ආඥපනතේ විධිවිධානයන්ට යටත්ව තැන්පත් කිරීම කළ හැකි වූ සුරැකුම් පත් ලෙස, මෙයින් ප්‍රකාශිතව ම අනුමත කරනු ලැබේ.

11-237

---

## සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥපනත

(127 වැනි අධිකාරය වන) සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥපනතේ 3 වෙනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල අනුව වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති පහළ රාලලාගේ රත්නායක වන මම, (124 වැනි අධිකාරය වන) සමුපකාර සමිති ආඥපනත හා එය යටතේ පනවා ඇති ව්‍යවස්ථා යටතේ රෙජිස්ත්‍රාර්ට අයත් බලතල, සමුපකාර සංවර්ධන කොමසාරිස්ට සහාය වීමට පත් කරන ලද තැනැත්තකු වන ගමෙගේ පියදාස හත්තොටුව මහතා වෙත මේ ආඥවෙන් පවරමි.

පී. ආර්. රත්නායක,
වැඩබලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1970 ඔක්තෝබර් මස 27 වැනිදා,
330, යූනියන් පෙදෙස,
කොළඹ 3.

11-238

---

## සමගි මණ්ඩල පනත

### ආඥව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ඇබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 දෙසැම්බර් 26 දින අංක 14,886 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 33 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ බඹරබොටුව ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) ගල්ලෑල්ල, නුගේපොල පදිංචි හෙට්ටි වීරසිංහගේ කුලරත්න මහතා.

(2) වේවැල්වත්ත, හෙට්ටිගම පදිංචි වේවැල් හේවගේ කරෝලිස් මහතා.

(3) ගල්ලෑල්ල, බානාගොඩ පදිංචි දෙමනගම්මන ගම ඇතිගේ ඩිංගිරිහාමි මහතා.

(4) ගල්ලෑල්ල පදිංචි කුඩාගමගේ ධර්මසිරි කරුණාරත්න මහතා.

(5) ගල්ලෑල්ල පදිංචි ලියන ආරච්චිගේ පොඩි අප්පුහාමි මහතා,

(6) ගල්ලෑල්ල, නුගේපොල පදිංචි රත්ගම කට්ටඩිගේ සියදෝරිස් මහතා.

(7) ගල්ලෑල්ල, අමුණුතැන්න පදිංචි දීගොඩ ගමගේ පේමදාස මහතා.

(8) ගල්ලෑල්ල, ගලබඩ පදිංචි ගලබඩ ආරච්චිගේ ගුණරත්න මහතා.

(9) ගල්ලෑල්ල, අමුණුතැන්න පදිංචි තනිප්පුලි මුදියන්සේලාගේ ඉන්ද්‍රසේන මහතා.

(10) වේවැල්වත්ත, දෙහෙනකන්ද, අංක 41 හි පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ රංබණ්ඩාර මහතා.

(11) ලෙල්ලොපිටිය, හීන්බැරැන්ඩුව පදිංචි වියන්නලාගේ සයනේරිස් මහතා.

(12) ගල්ලෑල්ල, මහබාගේ, ඕවල පදිංචි ඕවල රදාගේ ජූවානිස් මහතා.

(13) ගල්ලෑල්ල, බානගොඩ පදිංචි තනිප්පුලි මුදියන්සේලාගේ විජේසිංහ නිලමේ මහතා.

(14) ගල්ලෑල්ල, බානගොඩ පදිංචි නානාන්තිරිගේ ඩැනියෙල් වීරසිංහ මහතා.

(15) වේවැල්වත්ත, නාහිටිය පදිංචි නාහිටිය කට්ටඩිගේ සයනේරිස් මහතා.

(16) වේවැල්වත්ත, කදුරුගලවත්ත පදිංචි බවේවෙල කංකානමලාගේ සයිමන් මහතා.

(17) වේවැල්වත්ත, පොල්වත්ත පදිංචි වරකාගොඩගේ දොන් පත්මසේන මහතා.

(18) බලංගොඩ, ගුරුබැවිලාගම පදිංචි ගයින්නා වත්තේ දුවිතාලාගේ සුබේරිස් මහතා.

(19) බලංගොඩ, ගුරුබැවිලාගම, අලුපොල විදුහලේ ජනාකංකානමලාගේ ධනවර්ධන සමරනායක මහතා.

(20) බලංගොඩ, ගුරුබැවිලාගම, රිල්හේන්ගම පදිංචි ලියන ආරච්චිගේ ගුණරත්න මහතා.

(21) වේවැල්වත්ත, පොල්වත්ත පදිංචි දොන් අමරසිංහ ගුණසේකර මහතා.

(22) වේවැල්වත්ත, පැලෑඳගම පදිංචි ලයනල් වීරරත්න මහතා.

(23) බලංගොඩ, ගුරුබැවිලාගම, මැද්දෙගොඩ පදිංචි මුගුණකඳ වැල්ල කංකාණමලාගේ පුලිහිංගෙ වත්තෙ ධනපාල මහතා.

(24) බලංගොඩ, ගුරුබැවිලාගම පදිංචි දික්කුඹුරගේ සුමනරත්න මහතා.

(25) වේවැල්වත්ත, පැලෑඳගම පදිංචි නාහිටියෙ කට්ටඩිගේ සිරිසුන්දර මහතා.

(ආ) ගල්ලෑල්ල, නුගේපොල පදිංචි හෙට්ටි වීරසිංහගේ කුලරත්න මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

197C ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-251

---

ඇල්. ඩී.—බී. 17/60

## සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

### 29(3) දරන වගන්තිය යටතේ කරන නිවේදනය

(129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ පිහිටුවා ඇති වේතන විනිශ්චය මණ්ඩලය විසින් කරන ලද්දවූ ද, එම පනතේ 28 වැනි වගන්තිය යටතේ ස්ථිර කරන ලද්දවූද, මෙහි පහත සඳහන් තීරණයේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් සාප්පුවල සහ එම සාප්පුවලට අදළ කාර්යාලවල සේවයේ නියුක්ත සේවකයින් වෙනුවෙන් වූ තීරණය කම්කරු ගරු ඇමතිතුමන් විසින් ස්ථිර කරන ලද බව එම පනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගොගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

## තීරණය

1. මෙහිවූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් සෑම සාප්පුවකම සහ එම සාප්පුවලට අදාල කාර්යාලවල සේවයේ නියුක්ත මෙහි පහත නිශ්චිතව සඳහන් සේවක පංතිවලට මේ තීරණය අදාල විය යුතුය :—

(1) විකුණුම් කාරියන් සහ වැකර්වරුන් ඇතුළුව විකුණුම් කරුවෝ ;

(2) ඇහුරුම්කරුවන්, පියුන්වරුන්, පණිවුඩ ගෙනයන ළමුන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, කවුන්ටරයේ සේවය කරන ළමුන්, පාපැදි ළමුන් සහ ඕඩර්ලිවරුන් ඇතුළුව සාප්පු සේවක පිරිමි ළමෝ ;

(3) වාප්පු ලිපිකරුවන් හැර යතුරු ලියන්නන් සහ ලෙජර් ලිපිකරුවන් ඇතුළු ලිපිකරුවෝ ;

(4) අයකැමියෝ ;

(5) දුරකථන ක්‍රියාකරුවෝ ;

(6) ගබඩාකරුවෝ ;

(7) කම්කරුවෝ.

2. පළවෙනි ඡේදයේ සඳහන්, යම් සාප්පුවක සහ කාර්යාලයක සේවයෙහි යොදවා ඇති යම් සේවකයෙකු සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය පහත සඳහන් ආකාරයට විය යුතුය :—

| මාසයක් සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය | සේවක පන්තිය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සේවා වර්ෂය | විකුණුම්කාරියන් සහ වැකර්වරුන් ඇතුළුව විකුණුම් කරුවෝ | | ඇහුරුම් කරුවන්, පියුන් වරුන්, පණිවුඩ ගෙනයන ළමුන්, බඩුබාහිරාදිය බෙදන ළමුන්, කවුන්ටරයේ සේවය කරන ළමුන්, පාපැදි ළමුන් සහ ඕඩර්ලිවරුන් ඇතුළුව සාප්පු සේවක පිරිමි ළමුන් | | වාප්පු ලිපිකරුවන් හැර යතුරු ලියන්නෝ සහ ලෙජර් පොත් ලිපිකරුවන් ඇතුළු ලිපිකරුවෝ | | අය කැමියෝ | | දුරකථන ක්‍රියාකරුවෝ | | ගබඩා කරුවෝ | | කම් කරුවෝ | |
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| රැකියාවේ යෙදී ඇති 1 වැනි සේවා වර්ෂය තුළ | 160 | 0 | 110 | 0 | 175 | 0 | 240 | 0 | 160 | 0 | 240 | 0 | 100 | 0 |
| රැකියාවේ යෙදී ඇති 2 වැනි සේවා වර්ෂය තුළ | 170 | 0 | 115 | 0 | 185 | 0 | 250 | 0 | 170 | 0 | 250 | 0 | 105 | 0 |
| රැකියාවේ යෙදී ඇති 3 වැනි සේවා වර්ෂය තුළ | 180 | 0 | 120 | 0 | 195 | 0 | 260 | 0 | 180 | 0 | 260 | 0 | 110 | 0 |
| රැකියාවේ යෙදී ඇති 4 වැනි සේවා වර්ෂය තුළ | 190 | 0 | 125 | 0 | 205 | 0 | 270 | 0 | 190 | 0 | 270 | 0 | 115 | 0 |
| රැකියාවේ යෙදී ඇති 5 වැනි සේවා වර්ෂය තුළ | 200 | 0 | 130 | 0 | 215 | 0 | 280 | 0 | 200 | 0 | 280 | 0 | 120 | 0 |
| රැකියාවේ යෙදී ඇති 6 වැනි සේවා වර්ෂය තුළ | 210 | 0 | 135 | 0 | 225 | 0 | 290 | 0 | 210 | 0 | 290 | 0 | 125 | 0 |
| රැකියාවේ යෙදී ඇති 7 වැනි සේවා වර්ෂය තුළ | 220 | 0 | 140 | 0 | 235 | 0 | 300 | 0 | 220 | 0 | 300 | 0 | 130 | 0 |
| රැකියාවේ යෙදී ඇති 8 වැනි සේවා වර්ෂය තුළ | 230 | 0 | 145 | 0 | 245 | 0 | 310 | 0 | 230 | 0 | 310 | 0 | 135 | 0 |
| රැකියාවේ යෙදී ඇති 9 වැනි සේවා වර්ෂය තුළ | 240 | 0 | 150 | 0 | 255 | 0 | 320 | 0 | 240 | 0 | 320 | 0 | 140 | 0 |
| රැකියාවේ යෙදී ඇති 10 වැනි සේවා වර්ෂය තුළ | 250 | 0 | 155 | 0 | 265 | 0 | 330 | 0 | 250 | 0 | 330 | 0 | 145 | 0 |
| රැකියාවේ යෙදී ඇති 11 වැනි සේවා වර්ෂය තුළ | 260 | 0 | 160 | 0 | 275 | 0 | 340 | 0 | 260 | 0 | 340 | 0 | 150 | 0 |
| රැකියාවේ යෙදී ඇති 12 වැනි සේවා වර්ෂය තුළ | 270 | 0 | 170 | 0 | 285 | 0 | 350 | 0 | 270 | 0 | 350 | 0 | 157 | 50 |
| රැකියාවේ යෙදී ඇති 13 වැනි සේවා වර්ෂය තුළ | 280 | 0 | 180 | 0 | 295 | 0 | 360 | 0 | 280 | 0 | 360 | 0 | 165 | 0 |
| රැකියාවේ යෙදී ඇති 14 වැනි සේවා වර්ෂය තුළ | 295 | 0 | 190 | 0 | 310 | 0 | 370 | 0 | 295 | 0 | 370 | 0 | 172 | 50 |
| රැකියාවේ යෙදී ඇති 15 වැනි සේවා වර්ෂය තුළ | 310 | 0 | 200 | 0 | 325 | 0 | 380 | 0 | 310 | 0 | 380 | 0 | 180 | 0 |
| රැකියාවේ යෙදී ඇති 16 වැනි සේවා වර්ෂය තුළ | 325 | 0 | 210 | 0 | 340 | 0 | 390 | 0 | 325 | 0 | 390 | 0 | 187 | 50 |
| රැකියාවේ යෙදී ඇති 17 වැනි සේවා වර්ෂය තුළ | 340 | 0 | 220 | 0 | 355 | 0 | 400 | 0 | 340 | 0 | 400 | 0 | 195 | 0 |
| රැකියාවේ යෙදී ඇති 18 වැනි සේවා වර්ෂය තුළ | 355 | 0 | 230 | 0 | 370 | 0 | 410 | 0 | 355 | 0 | 410 | 0 | 202 | 50 |
| රැකියාවේ යෙදී ඇති 19 වැනි සේවා වර්ෂය තුළ | 370 | 0 | 240 | 0 | 385 | 0 | 420 | 0 | 370 | 0 | 420 | 0 | 210 | 0 |
| රැකියාවේ යෙදී ඇති 20 වැනි සේවා වර්ෂය තුළ | 385 | 0 | 250 | 0 | 400 | 0 | 430 | 0 | 385 | 0 | 430 | 0 | 217 | 50 |
| රැකියාවේ යෙදී ඇති 21 වැනි සේවා වර්ෂය තුළ | 400 | 0 | 260 | 0 | 415 | 0 | 440 | 0 | 400 | 0 | 440 | 0 | 225 | 0 |
| රැකියාවේ යෙදී ඇති 22 වැනි සේවා වර්ෂය තුළ | 415 | 0 | 270 | 0 | 430 | 0 | 440 | 0 | 415 | 0 | 440 | 0 | 232 | 50 |
| රැකියාවේ යෙදී ඇති 23 වැනි සේවා වර්ෂය තුළ සහ ඊට පසු සෑම වර්ෂයක් තුළම | 430 | 0 | 280 | 0 | 445 | 0 | 440 | 0 | 430 | 0 | 440 | 0 | 240 | 0 |

3. යම් සේව්‍යයකු යටතේ සේවය පිළිබඳව, මේ තීරණයේ 2 වෙනි ඡේදයේ සඳහන් "1 වෙනි සේවා වර්ෂය" යන ප්‍රකාශයෙන් එම සේව්‍යයා යටතේ සේවකයකු පළමුවෙන් සේවය ආරම්භ කළ දින සිට නොකඩවා මාස 12 ක කාලයක් අදහස් වේ.

4. මේ තීරණයේ කාර්යය සඳහා—

(1) " විකුණුම්කරුවෙකු " යනුවෙන් (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ අර්ථානුකූලව පාරිභෝගිකයින්ට වෙළඳාම් කිරීමේ කාර්යය සඳහා යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ ;

(2) " සාප්පුවේ පිරිමි ළමයා " යනුවෙන් සිල්ලර වැඩ කිරීමට යොදවා ඇති තැනැත්තෙකු අදහස් වන අතර ඊට ඇහුරුම්කරුවෙක්, පියන් වරයෙක්, පණිවුඩ ගෙනයන ළමයෙක්, බඩුබාහිරාදිය බෙදන ළමයෙක්, කවුන්ටරයේ සේවය කරන ළමයෙක්, පාපැදි ළමයෙක් සහ ඕඩර්ලිවරයෙක් ද ඇතුළත් වේ ;

(3) " ලිපිකරුවෙකු " යනුවෙන් යතුරු ලිවීම සහ ගිණුම් වැඩ ඇතුළු සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් ලිපිකාර වැඩෙහි නියුක්ත තැනැත්තෙක් අදහස් වේ ;

(4) " අයකැමියකු " යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් මුදල් භාරගැනීමට සහ හෝ ගෙවීමට ද, මුදල් භාරව සිටීමට ද, අවශ්‍ය වාර්තා සහ පොත්පත් පවත්වාගෙන යාමට සහ විධාන කළ විට මුදල් බැංකුවේ තැන්පත් කිරීමේ නියුක්තවීමට ද, යොදවනු ලබන තැනැත් තෙක් අදහස් වේ ;

(5) " දුරකථන ක්‍රියාකරුවකු " යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් දුරකථන යතුරු පුවරු ක්‍රියාකරවීමටද, දුරකථනයෙන් ඇමතුම් කිරීමට හා ඇමතුම් ලබා ගැනීමටද, දුරකථන විමසුම්වලට පිළිතුරුදීමට හා ඊට අදළ වාර්තා පවත්වාගෙන යාමටද, යොදවනු ලබන තැනැත්තෙක් අදහස් වේ ;

(6) " ගබඩාකරුවකු " යනුවෙන් තොග වශයෙන් බඩු ගබඩාකර ඇති ගබඩා කාමරයක් භාරව සිටීමට යොදවා ඇති හා එවැනි ගබඩා කිරීමේ කටයුතුවලට අදල පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට වගකිව යුතු තැනැතෙකක් අදහස් වේ ;

(7) " කම්කරුවකු " යනුවෙන් ඕනෑම නුපුහුණු කායිකයක් කිරීමට යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ.

## උපලේඛනය

| | | |
|---|---|---|
| 1. | වී. ඇම්. අබබෝ සහ සමාගම | 230, කෙලින් වීදිය, කොළඹ 11 |
| 2. | අබ්දුල් කයූම් සහ සමාගම | 126, කුමාර වීදිය, කොළඹ 11 |
| 3. | අබ්දුල් ලතීෆ් සුලෙයිමාන් සහ සමාගම | 129–131, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 4. | අබ්දුල් ට්‍රේඩිං කොම්පැණි | 145, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 5. | එච්. එච්. අබ්දුල් කරීම් සහ සමාගම | 202, 204, කෙලින් වීදිය, කොළඹ 11 |
| 6. | අබ්දුල් හුසේන් ජැපර්ජී | 240, කෙලින් වීදිය, කොළඹ 11 |
| 7. | කේ. ඇස්. අබුසාලි සහ සහෝදරයෝ | 53, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 8. | ඇඩම් ටෙක්ස්ටලිස් | 94, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 9. | අහමඩ් සමාගම ... | 52, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 10. | එච්. ඒ. අහමඩ් සහ සමාගම | 38, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 11. | අකෝසා සහ සමාගම | 25, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 12. | අරුණාලෝක ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 9, චීන වීදිය, කොළඹ 11 |
| 13. | ආනන්ද ස්ටෝර්ස් | 105, බංගසාල වීදිය, කොළඹ 11 |
| 14. | අන්වර් ටෙක්ස්ටයිල්ස් | 92, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 15. | ආනන්ද සහ සමාගම | 178, හෙට්ටි වීදිය කොළඹ 11. |
| 16. | අනුලා ටෙක්ස්ටයිල්ස් | 143, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 17. | ඒ. ඩී. පී. අප්පුහාමි | 105, පළමුවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 18. | ඒ. ආර්. එස්. ආරුමුගම් චෙට්ටියාර් | 81, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 19. | ආර්ජාන්ස් | 179, කෙලින් වීදිය, කොළඹ 11 |
| 20. | අරීෆ් ස්ටෝර්ස් ... | 105, නොරිස් පාර, කොළඹ 11 |
| 21. | අරීෆ් ට්‍රේඩිං කොම්පැණි | 91, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 22. | බසර්මාල්ස් | 130, බංගසාල වීදිය, කොළඹ 11 |
| 23. | එල් මුල්චාන්ඩ් සමාගම | 43, 45, බංගසාල වීදිය, කොළඹ 11 |
| 24. | බක්ශිණි | 49, බංගසාල වීදිය, කොළඹ 11 |
| 25. | බනික් පැලස් | 80, කෙලින් වීදිය, කොළඹ 11 |
| 26. | බසීර් ට්‍රේඩර්ස් | 210, කෙලින් වීදිය, කොළඹ 11 |
| 27. | බ්‍රිටිෂ් එම්පයර් ස්ටෝර්ස් | 95සී, 1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 28. | එන්. එම්. එස්. බුහාරි හජ්ජියාර් | 17ඒ, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 29. | කාදර් සහ ඔස්මන් | 255, කෙලින් වීදිය, කොළඹ |
| 30. | කාර්ගිල්ස් (ලංකා) සීමාසහිත | තැ. පෙ. 23, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 31. | කයිමස් | 220, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 32. | සිලෝන්ස් ටෙක්ස්ටයිල්ස් කෝපරේෂන් | 124, බංගසාල වීදිය, කොළඹ 11 |
| 33. | සිලෝන් සින්තටික් ටෙක්ස්ටයිල්ස් මිල්ස් (සීමාසහිත) ප්‍රදර්ශනාගාරය | ත. බෙ. ස. ගොඩනැගිල්ල, කෙලින් වීදිය, කොළඹ 1 |
| 34. | සිලෝන්ස් හැන්ඩ්ලූම්ස් | 25, ගෆූර් ගොඩනැගිල්ල, කෙලින් වීදිය, කොළඹ 1 |
| 35. | සිලෝන් හැන්ඩ්ලූම්ස් | 69, කෙලින් වීදිය, කොළඹ 11 |
| 36. | සිලෝන් ටෙක්ස්ටයිල්ස් (සීමාසහිත) | 117–119, 2වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 37. | චයිනා සිල්ක් ස්ටෝර්ස් | 94, වැතැම් වීදිය, කොළඹ 1 |
| 38. | චයිනීස් ගිෆ්ට් ෂොප් | 98, වැතැම් වීදිය, කොළඹ 1 |
| 39. | පී. චන්දිරම් සහ පුත්‍රයෝ | හේමාස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 40. | චන්ද්‍රා ටෙකස්ටයිල්ස් | 41, බංගසාල වීදිය, කොළඹ 11 |
| 41. | චීප් සයිඩ් | 90, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 42. | චයිනීස් ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 237, කෙලින් වීදිය, කොළඹ 11 |
| 43. | චිත්‍රා ටෙක්ස්ටයිල්ස් | 97, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 44. | චන්ඩොමාල්ස් සහ පුත්‍රයෝ | 57, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 45. | සිටි ටෙක්ස්ටයිල්ස් | 125, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 46. | සිටි ඉන්ඩස්ට්‍රීස් | 602/8, රෙක්ලමේෂන් පාර, කොළඹ 11 |
| 47. | ස. තො. සේ. (මිලර්ස් ටෙක්ස්ටයිල්ස්) | මිලර්ස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ1 |
| 48. | කලම්බු ටෙක්ස්ටයල්ස් | 145, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 49. | ක්‍රවුන්ස් | 118, කෙලින් වීදිය, කොළඹ 11 |
| 50. | ඩවුඩ් මෝටි සහ සමාගම | 208, කෙලින් වීදිය, කොළඹ 11 |
| 51. | ඩේවිස් | 209, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 52. | දේව් ගාමන්ට්ස් | 63, 1/10, වැතැම් වීදිය, කොළඹ 1 |
| 53. | ඩබ්ලිව්. ධර්මදාස සහ සමාගම | 162, කෙලින් වීදිය, කොළඹ 11 |
| 54. | ඇම්. ධර්මදාස සහ සමාගම | 163, කෙලින් වීදිය, කොළඹ 11 |
| 55. | ඩයා ෂොප් | 90, කෙලින් වීදිය, කොළඹ 11 |
| 56. | ඊබ්‍රාහිම් අබුබකර් සහ පුත්‍රයෝ | 126, දෙවැනි හරස් වීදිය කොළඹ, 11 |
| 57. | ඊස්ටන් ටෙස්ටයිල්ස් | 145, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 58. | සීමාසහිත ඊස්ටන් සිල්ක් එම්පෝරියම් | 135, කෙලින් වීදිය, කොළඹ 11 |
| 59. | එම්පයර් ට්‍රේඩර්ස් | 36, රෙක්ලමේෂන් පාර, කොළඹ 11, |
| 60. | සීමායහිත එස්එස්සී (ලංකා) | 169, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 61. | එච්. එච්. ඉසා සහ සමාගම | 96, තුන්වෙනි හරස් වීදිය, කොළඹ1 |
| 62. | ෆැන්සි ටෙක්ස්ටයිල්ස් | 155, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 63. | ෆැෂන් වෙයාර් ... | 149, දෙවැනි හරස් වීදිය, කොළඹ 11 |
| 64. | ෆර්නැන්ඩු සමාගම | 131, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 65. | සීමාසහිත ඩී. සී. පර්නැන්ඩු සහ සමාගම | 242–244, කෙලින් වීදිය, කොළඹ 11 |
| 66. | ගෆූර්ස් සිල්ක්ස් ස්ටෝර්ස් | 104, වැතැම් වීදිය, කොළඹ 1 |
| 67. | ඇන්. ඇම්. ගානි සහ සමාගම | 126, 3 වෙනි හරස් වීදිය, කොළඹ 1 |
| 68. | ඒ. ආර්. ඒ. ගානි සහ පුත්‍ර මහතුන් | 144, කුමාර වීදිය, කොළඹ 11 |
| 69. | ග්‍රීන් පැලස් | 70, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 70. | ගුණවර්ධන ස්ටෝර්ස් | 111, පළමුවැනි හරස්වීදිය, කොළඹ1 |
| 71. | හබීබතයාබ් සමාගම | 228, කෙලින් වීදිය, කොළඹ 11 |
| 72. | හජ්ජි යූසුෆ් සහ සමාගම | 52, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 73. | පී. එම්. කේ. හජ්ජියාර් සහ සමාගම | 84, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 74. | හබීබී වලිමොහොමඩ් සහ සමාගම | 190, කෙලින් වීදිය, කොළඹ 11 |
| 75. | හමීඩියා කොමර්ෂල් සමාගම | 168, කෙසයිර් වීදිය, කොළඹ 11 |
| 76. | හැන්කෝ ටෙක්ස්ටයිල්ස් | 31, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 77. | ඇම්. හැරුනාස් සහ පුත්‍රයෝ | 161, කෙයිසර් වීදිය, කොළඹ 11 |

| | | |
|---|---|---|
| 78. | එච්. එච්. හයිම් | 250, කෙලින් වීදිය, කොළඹ 11 |
| 79. | එස්. එස්. කේ. හාජාඅලවුදීන් සහ පුත්‍රයෝ | 99, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 80. | ඩබලිව්. ඇම්. හයිම්. මහත්වරු | 232, කෙලින් වීදිය, කොළඹ 11 |
| 81. | සීමාසහිත හයිඩරාමනි | 158, පළමුවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 82. | පී. ඇම්. හයිතුරුස් සහ සමාගම | 122, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 83. | ඉබ්‍රාහිම් සහ පුත්‍රයෝ | 130, තුන්වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 84. | ඉන්ඩෝ ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 133, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 85. | අයිනුල් ස්ටෝර්ස් | 152, කෙලින් වීදිය, කොළඹ 11 |
| 86. | එච්. එම්. ස්මායිල් | 252, කෙලින් වීදිය, කොළඹ 11 |
| 87. | ස්මායිල් සහ පුත්‍රයෝ | 36, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 88. | එම්. එච්. ස්මායිල් සහ සමාගම | 164, 168, 151 දෙවැනි හරස් වීදිය, කොළඹ 11 |
| 89. | ඉම්පීරියල් ටෙක්ස්ටයිල්ස් | 103, බංගසාල වීදිය, කොළඹ 11 |
| 90. | ජමාල් හජ්ජි යූසුෆ්ජ් සහ සමාගම | 123, තුන්වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 91. | ජයතිස්ස සහෝදරයෝ | 2, කීර්ති පටුමග, කොළඹ 11 |
| 92. | ජයවර්ධන සහෝර මහතුන් | 7, කුමාර වීදිය, කොළඹ 11 |
| 93. | ජෙයිමා ඩ්‍රෙප්රි ස්ටෝර්ස් | 130, කෙලින් වීදිය, කොළඹ 11 |
| 94. | ජිනදස ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 109, පළමුවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 95. | ජිනදස සහ සමාගම | 110, පළවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 96. | ජනතා ටෙක්ස්ටයිල්ස් | 182, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 97. | ජොනො ලිවර් සහ සමාගම මහතුන් | 26, රෙක්ලමේෂන් පාර, කොළඹ 11 |
| 98. | කල්‍යාණී ට්‍රෙඩිං සමාගම | 123, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 99. | කල්‍යාණී ස්ටෝර්ස් | 6, හතරවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 100. | කලා ට්‍රෙඩිං සමාගම | 134, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 101. | ඇන්. කේ. කාලියප්පා පිල්ලේ සහ සමාගම | 234, කෙලින් වීදිය, කොළඹ 11 |
| 102. | කනන් සහ සමාගම | 115, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 103. | ඇෆ්ජ්. ඒ. කරීම් සහ සමාගම | 257/259, කෙලින් වීදිය, කොළඹ 11 |
| 104. | ඇම්. ඒ. කරීම් සහ සමාගම | 135, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 105. | කර්නාට් ටෙක්ස්ටයිල්ස් | 164, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 106. | එච්. එච්. කයිම් සහ සමාගම | 192, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 107. | ඒ. එස්. කසීම් සහ සමාගම | 78, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 108. | කාසි මාරි පලේකාට් සමාගම | 94, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 109. | ඒ. ආර්. කරීම් සහ සමාගම | 194, කෙලින් වීදිය, කොළඹ 11 |
| 110. | කිකාබායි ලලුබායි | 113, 115, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 111. | සීමාසහිත කුන්ඩන්මාල්ස් | 26, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 112. | කාර්ටාස් | 134, කෙලින් වීදිය, කොළඹ 11 |
| 113. | ලංකා ටෙක්ස්ටයිල්ස් | 109, කුමාර වීදිය, කොළඹ 11 |
| 114. | ලංකා බ්‍රිටිෂ් හැට්මාට් | 101, නොරිස් පාර, කොළඹ 11 |
| 115. | ලංකා වීවිං මිල්ස් (සීමාසහිත) වෙලෝනා | 112, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 116. | ලක්ෂමී සිල්ක්ස් ස්ටෝර්ස් | 113, වැතැම් වීදිය, කොළඹ 1 |
| 117. | ලෙව්වූමාන් ටෙක්ස්ටයිල්ස් | 78, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 118. | ලෝටස් ස්ටෝර්ස් | 157, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 119. | ඒ. ආර්. මහබූබ් සහ සමාගම | 21, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 120. | මැලිබන් ට්‍රෙඩර්ස් | 105, මැලිබන් වීදිය, කොළඹ 11 |
| 121. | මැලිබන් ටෙක්ස්ටයිල්ස් | 226, කෙලින් වීදිය, කොළඹ 11 |
| 122. | සීමාසහිත මන්ස්රාම් (ලංකා) | 95, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 123. | ඇස්. මරියාපිල්ලෙයි | 202, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 124. | මාර්ෂුක් සහ සමාගම | 173, 175, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 125. | ඇස්. ඇස්. ඒ. ඇම්. මාකර් | 86, වැතැම් වීදිය, කොළඹ 1 |
| 126. | මාටින් සහ සමාගම | 99, 1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 127. | සීමාසහිත මන්ගාරම්ස් | 143, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 128. | මන්සූරියා සහ සමාගම | 124, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 129. | මීර්කෝ | 20, 22, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 130. | මිසාන් ටෙක්ස්ටයිල්ස් | 134, කුමාර වීදිය, කොළඹ 11 |
| 131. | එච්. ජී. මෙන්ඩිස් සිල්වා | 73, 1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 132. | මෙල්වානි බ්‍රදර්ස් | 129ඒ. කෙලින් වීදිය, කොළඹ 11 |
| 133. | මිල්ඩ්‍රඩ් ඩ්‍රෙස් මේකිං | 16/18, රෙක්ලමේෂන් පාර, කොළඹ 11 |
| 134. | මිලට් ටෙක්ස්ටයිල් මහතුන් | 254, කෙලින් වීදිය කොළඹ 11 |
| 135. | ටී. ඒ. මිස්කිං | 119, 3 වෙනි හරස් වීදිය කොළඹ 11 |
| 136. | මොඩර්න් ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 83, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 137. | ටී. එස්. එම්. ඕ. මොහොමඩ් උදුමා සාහිබ් | 60, 2 හරස් වීදිය, කොළඹ 11 |
| 138. | එම්. ඕ. එස්. මොහොමඩ් ලෙබ්බෙ සහ සම ගම | 103, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 139, | ඊ. ඇන්. මොහොමඩ් සහ සමාගම | 66, 2, වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 140. | මොහන්දස් සහ පුත්‍රයෝ | 155, කෙලින් වීදිය, කොළඹ 11 |
| 141. | මොහිඩීන් සන්ස් ටෙක්ස්ටයිල්ස් | 92, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 142. | ඒ. ඇස්. එම්. මොහිදීන් පිල්ලෙයි සහ සමාගම | 157, කෙයිසර් වීදිය ,කොළඹ 11 |
| 143. | ඇම්. කේ. ඇල්. ඇස්. මොහොමඩ් ලෙබ්බෙ සහ පුත්‍රයෝ | 162, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 144. | එස්. එම්. ඒ. මොහොමඩ් මොහිදීන් සහ සමාගම | 176, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 145. | එම්. කේ. ඒ. මොහොමඩ් හනීෆ්ප් මීරාන් සහ සහෝදරයෝ | 137, කුමාර වීදිය, කොළඹ 11 |
| 146. | මොහිඩීන්ස් | 256, කෙලින් වීදිය, කොළඹ 11 |
| 147. | සී. මුල්වාන්ඩ් | 134, බංගසාල වීදිය, කොළඹ 11 |
| 148. | මූසා ටෙක්ස්ටයිල්ස් | 97, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 149. | මෝගන් ඉන්ඩස්ට්‍රීස් | 53, බංගසාල වීදිය, කොළඹ 11 |
| 150. | මෝටිරාම් සහ පුත්‍රයෝ | 175, කෙලින් වීදිය, කොළඹ 11 |
| 151. | ඒ. ආර්. ඇම්. මුක්තාර් | 188, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 152. | මුරුගන් පලයකාට් සමාගම මහතුන් | 241, කෙලින් වීදිය, කොළඹ 11 |
| 153. | කේ. මුත්තුසාමි පිල්ලේ සහ සමාගම | 157, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 154. | නාගමුත්තු සහ පුත්‍රයෝ | 111, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 155. | ඇම්. නාච්චි මුත්තු | 169, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |

| | | |
|---|---|---|
| 156. | නාඩාර් සමාගම | 212, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 157. | නෙල්සන් සහ සමාගම | 68, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 158. | නිතන් ස්ටෝර්ස් | 52, කෙලින් වීදිය, කොළඹ 11 |
| 159. | නැෂනල් ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 85, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 160. | නිව් ඇන්තනි ස්ටෝර්ස් | 82, කෙලින් වීදිය, කොළඹ 11 |
| 161. | නිව් ඩෙකා සාරි හවුස් | 121, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 162. | ද නවල්ටි ස්ටෝර්ස් | 111, මැලිබන් වීදිය, කොළඹ 11 |
| 163. | ඔරියන්ටල් ලුන්ගි සමාගම | 159, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 164. | පාර්වතී පලයකාට් සමාගම | 112, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 165. | පී. පරමානන්ද | 184, කෙලින් වීදිය, කොළඹ 11 |
| 166. | පවුලස් සහ සමාගම මහතුන් | 198–200, කෙලින් වීදිය, කොළඹ 11 |
| 167. | ඒ. ජේ. පීරිස් | 135, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 168. | ඇස්. පී. පෙරියන්නා පිල්ලේ සහ සමාගම | 180, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 169. | ඇම්. ඇස්. ටී. කේ. ඇන්. පෙරියන්නා පිල්ලේ සහ සමාගම | 165, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 170. | පෙටා ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 161, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 171. | ප්‍රිමියර් ලංකා ටෙක්ස්ටයිල්ස් සීමාසහිත | 121, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 172. | ප්‍රේමවර්ධන ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 6, ශාන්ත ජෝන්ස් පාර, කොළඹ 11 |
| 173. | ප්‍රින්ස් ටෙක්සස් | 81, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 174. | කොලිටෙක්ස් | 80, 1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 175. | ක්වීන්ස් ස්ටෝර්ස් | 103–105, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 176. | ක්වීන්ස් | 108, කෙලින් වීදිය, කොළඹ 11 |
| 177. | රාධා ටෙක්ස්ටයිල්ස් | 129, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 178. | රෆීක් ට්‍රේඩිං කම්පැණි | 84–86, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 179. | රාජ් ටෙක්ස්ටයිල්ස් | 140, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 180. | රාජා ස්ටෝර්ස් | 139, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 181. | රානි ස්ටෝර්ස් | 214, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 182. | රන්ජිද ටෙක්ස්ටයිල්ස් | 136, 2 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 183. | ජේ. ඇන්. රාමස්වාමීස් සහ පුත්‍රයෝ | 8, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 184. | රන්ජනාස් | 52, බංසාල වීදිය, කොළඹ 11 |
| 185. | රන්ජීස් | 82, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 186. | රත්න ස්ටෝර්ස් | 128, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 187. | රවින්ද්‍ර ටෙක්ස්ටයිල්ස් | 112, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 188. | රීගල්ස් | 164, කෙලින් වීදිය, කොළඹ 11 |
| 189. | රිජ්වේ ටෙක්ස්ටයිල්ස් | 160,1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 190. | රොබට් ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 47, මැලිබන් වීදිය, කොළඹ 11 |
| 191. | රූබිනි ටෙක්ස්ටයිල්ස් | 63, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 192. | රූබී ටෙක්ස්ටයිල්ස් | 171, කෙලින් වීදිය, කොළඹ 11 |
| 193. | සිඩික් ස්ටෝර්ස් | 123, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 194. | ඇස්. ඒ. සාහුල් හමීඩ් සහ පුත්‍රයෝ | 47, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 195. | සගාර් සමාගම | 105, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 196. | සක්ති ටෙක්ස්ටයිල්ස් | 113, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 197. | සරතාස් | 196, කෙලින් වීදිය, කොළඹ 11 |
| 198. | සරස්වතී ස්ටෝර්ස් | 75, 77, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 199. | එස්. ටී. ආර්. සලිමොහොමඩ් සහ සමාගම | 245, කෙලින් වීදිය, කොළඹ 11 |
| 200. | සලිම් ටෙක්ස්ටයිල්ස් | 76, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 201. | සංගානි සහෝදරයෝ | 27, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 202. | සරස්වතී ටෙක්ස්ටයිල්ස් | 55, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 203. | ඒ. ඒ. සතාර් සහ සමාගම | 80, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 204. | සරතාස් | 96, 98, යෝර්ක වීදිය, කොළඹ 1 |
| 205. | සෙල්වාස් | 31, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 206. | සෙකාස් | 44, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 207. | සිලෙක්සන්ස් | 9, යෝර්ක් වීදිය, කොළඹ 11 |
| 208. | එම්. කේ. එස්. සයිඩ් මොහමඩ් සහ සමාගම | 216, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 209. | ශාන්ති ස්ටෝර්ස් | 4, ශාන්ත ජෝන්ස් පාර, කොළඹ 11 |
| 210. | ෂෙරාස් ටෙක්ස්ටයිල්ස් | 90, 92, බංගසාල වීදිය, කොළඹ 11 |
| 211. | ෂැන්හයි සිල්ක්ස් ස්ටෝර්ස් | 111, වැතැම් වීදිය, කොළඹ 1 |
| 212. | ෂකාර් සහ සමාගම | 59, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 213. | සිඩීක් ඩ්‍රෙපරි ස්ටෝර්ස් | 62, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 214. | සිරුල් කදිරි සහ සමාගම | 41, 43, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 215. | සිල්වර්ටන් ටෙක්ස්ටයිල්ස් | 104, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 216. | සිඩික් ටෙක්ස්ටයිල්ස් | 167, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 217. | සෝබරාජ් රෙලූමාල් | 100, කෙලින් වීදිය, කොළඹ 11 |
| 218. | සෝමාර් ටෙක්ස්ටයිල්ස් සමාගම | 212, කෙලින් වීදිය, කොළඹ 11 |
| 219. | වී. ජී. සන්ස් | 132, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 220. | සිංගාරම්ස් | 47, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 221. | සරවනාස් | 148, කෙලින් වීදිය, කොළඹ 11 |
| 222. | සෞඩගාර්ස් | 76, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 223. | ශ්‍රී කාන්ති ස්ටෝර්ස් | 107, නොරිස් පාර, කොළඹ 11 |
| 224. | ශ්‍රී කුමාරන් ටෙක්ස්ටයිල්ස් | 96, 98, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 225. | ස්ටැන්ලීස් | 192, කෙලින් වීදිය, කොළඹ 11 |
| 226. | ඩබ්ලිව්. ස්ටීවන් පෙරේරා සහ පුත්‍රයෝ | 2, ශාන්ත ජෝන් පාර, කොළඹ 11 |
| 227. | සූට් හවුස් | 58, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 228. | සුලෙයිමාන් වලිමොහමඩ් සහ සමාගම | 214, කෙලින් වීදිය, කොළඹ 11 |
| 229. | සුපීරියර් පලෙයකාට් සමාගම | 118, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 230. | සයිඩ් ඇන්ඩ් හුසේන් | 107, කුමාර වීදිය, කොළඹ 11 |
| 231. | එස්. එච්. ටෙක්ස්ටයිල්ස් | 149, කෙලින් වීදිය, කොළඹ 11 |
| 232. | තඩ්ලානි සහෝදරයෝ | 118, බංගසාල වීදිය, කොළඹ 11 |
| 233. | ද ඉන්ඩො සිලෝන් ටෙක්ස්ටයිල්ස් සමාගම | 142, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |

| | | |
|---|---|---|
| 234. | ද නිව් වයිනීස් ෂොප් | 84, වැතැම් වීදිය, කොළඹ 1 |
| 235. | ඒ. ටී. පී. ඇම්. කේ. තෙවරාජා පිල්ලයි සහ සමාගම | 58, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 236. | තිරුවල්ලුවාර් ස්ටෝර්ස් | 105, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 237. | කේ. තිරත්දස් සහ පුත්‍රයෝ | 151, කෙලින් වීදිය, කොළඹ 11 |
| 238. | වරේඩ් එක්ස්චේන්ජ් සිලෝන් ලිමිටඩ් (ලක්ලූමස්) | 69, ක්වීන්ස් වීදිය, 1 වෙනි මහල, සෙලින්කෝ මන්දිරය, කොළඹ 1 |
| 239. | වරිමයිට | 161, කෙලින් වීදිය, කොළඹ 11 |
| 240. | උකුම්වාන්ඩ් | 61, වැතැම් වීදිය, කොළඹ 1 |
| 241. | වලිමොහොමඩ් අබ්දුල් රහුමාන් සහ සමාගම | 125, 127, කයිසර් වීදිය, කොළඹ 11 |
| 242. | ඇම්. වේලායුදම් සහ සහෝදරයෝ | 61, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 243. | වෙලෝනා ගාමන්ට්ස් | 58, තැවැම් වීදිය, කොළඹ 1 |
| 244. | වෙලෝනා ෂොප් (ලංකා වීවිං මිල්ස් ලිමිටඩ්) | 83, යෝර්ක් වීදිය, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 245. | කේ. වෙන්කර්ටාසන් | 71, 73, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 246. | එම්. වේතනායගම් | 49, හෙට්ටි වීදිය, කොළඹ 11 |
| 247. | විජය කෝපරේෂන් | 243, කෙලින් වීදිය, කොළඹ 11 |
| 248. | විජිත ටෙක්ස්ටයිල්ස් | 81, 83, කෙලින් වීදිය, කොළඹ 11 |
| 249. | විලාසිනී සහ සමාගම | 148, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 250. | විජය සුරේෂ් | 110, 3 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 251. | වෝග් කෝනර් | 108, වැතැම් වීදිය, කොළඹ 1 |
| 252. | සීමාසහිත වැල්ලවත්ත ස්පිනින් ඇන්ඩ් වීවිං මිල්ස් (සේල්ස්රූම්) | 69, රජින වීදිය, කොළඹ 1 |
| 253. | වෙලින්ටන් ටෙක්ස්ටයිල්ස් | 75, කෙයිසර් වීදිය, කොළඹ 11 |
| 254. | යාල්ටන් ස්ටෝර්ස් | 82, 1 වෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 255. | යූසුප් අබ්දුල් සකූර් සහ සමාගම | 109, 111, කයිසර් වීදිය, කොළඹ 11 |
| 256. | ඒ. කේ. යූසුප් සහ පුත්‍රයෝ | 216, දෙවෙනි හරස් වීදිය, කොළඹ 11 |
| 257. | සුබයිදස් | 139, හෙට්ටි වීදිය, කොළඹ 11 |

11-284

---

එල්. ඊ.—බී. 16/54.

## සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

### 7 වැනි වගන්තිය යටතේ ආඥව

පසුව සංශෝධනය කරනු ලැබූ පරිදි, (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 7 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1965 අංක 17 දරන නිවාඩු ආඥපනතෙහි අර්ථානුකූලව නිවාඩු දින වන්නාවූ ද, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇත්තාවූද දවස් ඉහත කී වගන්තියේ කාර්යයන් සඳහා නිවාඩු දවස් වශයෙන් මෙම ආඥවෙන් ප්‍රකාශ කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

(1) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය වන 1971 මැයි මස 10 වැනි දින,

(2) බණ්ඩාරනායක අනුස්මරණ දිනය වන 1971 සැප්තැම්බර් මස 26 වැනි දින.

11-391

---

ආඥ අංකය : 11

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇත්තාවූ ද ඉඩම අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීරී 13/70-එච්ඞී/එල්ඒ/8.
වර්ෂ 1970 ඔක්තෝබර් 31 දින, කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සහ සීමාව තුලවූ වැල්ලවත්ත (දකුණ) කොට්ඨාශයේ ගාලු පාරේ වරිපනම් අංක 318 දරණ ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණ වූ ඉඩම් කොටස් 1 ට මායිම් :

උතුරට : ගාලු පාරේ වරිපනම් අංක 310 දරණ ඉඩම ;

නැගෙනහිරට : ගාලු පාර ;

දකුණට : 36 වන පටුමග ;

බටහිරට : 36 වන පටුමගේ වරිපනම් අංක 12 දරණ ඉඩම.

හිමිකම් කියන අය : සීමාසහිත යූ. එන්. විජේතුංග සහ සමාගම, 153, කෙළින් වීදිය, කොළඹ 11.

11-367/1

---

ආඥ අංකය : 12

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇත්තාවූ ද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීරී 13/70-එච්ඞී/එල්ඒ/8
වර්ෂ 1970 ඔක්තෝබර් 31 දින, කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ දෙනිපිටිය ගමේ බුහක්මනගේ වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණවූ ඉඩම් කොටස් 1 ට මායිම් :

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : වැලිගම-දෙනිපිටිය පාර.

හිමිකම් කියන අය : ඩේවිඩ් මැන්ඩිස් ගුණවර්ධන මහතා, ගලල්ල වත්ත, දෙනිපිටිය.

11-367/2

ආඥා අංකය : 13.

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූ ද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පී. ඊ. 13/70—එච්ඩී/එල්ඒ/8
වර්ෂ 1970 ඔක්තෝබර් 31 දින, කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දෙනිපිටිය ගමේ පිහිටි කුකුලල හිටවපු කොරටුව නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණවූ ඉඩම් කොටස් 1 ට මායිම් :

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : දෙනිපිටිය-පොල්වතුමෝදර පාර ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;

බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

හිමිකම් කියන අය : ජේ. වී. දයාරත්න මයා., ගහලගෙ වත්ත, දෙනිපිටිය ; ඇලිස් සමරවික්‍රම මිනී., ' සුසන්ත ' දෙනිපිටිය පී. එම්. සමරවික්‍රම, විශ්‍රාම ලත් රෙජිස්ට්‍රාර් තැන, දෙනිපිටිය.

11-367/3

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

(වොකලට් සෑදීම ඇතුළු) බිස්කෝතු හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින්ව සිටි රංජිත් ඒකනායක, හෙන්රි ධර්මසේන සහ සමාදාන විනිශ්චයකාර ඒ. ජේ. ඇම්. ලතීෆ්ර් යන මහතුන් වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියමකොට පත්කළ සාමාජිකයින් ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් සිරිපාල කදුමුල්ල, පී. බී. රාජපක්ෂ සහ එස්. එම්. රෆීක් යන මහතුන් පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-271

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

1970 මාර්තු මස 18 වන දින සිට අවුරුදු තුනක කාලයක් තුළ දුම්කොළ කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත්කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නම නියමකොට පත්කරන සාමාජිකවරු :

1. ඒ. ආර්. ඇම්. අබේනායක මහතා
2. ජී. වී. පුංචි නිලමේ මහතා
3. ජේ. රත්නායක මිහිරිගමගේ මහතා

සේව්‍ය නියෝජිත සාමාජිකවරු :

1. ඇල්. ඊ. වීරසේකර මහතා
2. ඇස්. වී. වනිගසේකර මහතා
3. ඇම්. කාන්තරතිනම් මහතා
4. යූ. බී. වලලවෙල මහතා
5. ඇල්. බී. දිසානායක මහතා
6. ඇස්. ඇස්. ඇම්. කාසිම් මහතා
7. එච්. ඇල්. චිත්‍රපාල මහතා

සේවක නියෝජිත සාමාජිකවරු :

1. ඩබ්ලිව්. ජී. රත්නායක මහතා
2. ඇස්. සෙල්ලයියා මහතා
3. ඊ. ඒ. ජේ. අමරසේකර මහතා
4. ඩී. ඕ. යහම්පත් මහතා
5. ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
6. වෝල්ටර් ජෝතිපාල මහතා
7. ඒ. බී. වීරකෝන් මහතා

11-272

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

1970 මාර්තු මස 25 වන දින සිට අවුරුදු තුනක කාලයක් තුළ හෝසියරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත්කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නම නියමකොට පත්කරන සාමාජිකවරු :

1. කරුණාරත්න බෝධිනාගොඩ මහතා
2. ආර්. පී. ධම්සේන මහතා
3. ඇස්. නාගේන්ද්‍ර මහතා

සේව්‍ය නියෝජිත සාමාජිකවරු :

1. ලෙස්ලි ජී. පීරිස් මහතා
2. වී. ඇස්. ඇම්. ද මැල් මහතා
3. කේ. විජයරත්නම් මහතා
4. ඩී. ඊ. මැන්ඩිස් මහතා
5. ලොයිඩ් ද මැල් මහතා
6. බර්නාඩ් ඒ. බොතේජු මහතා
7. ඩබ්ලිව්. එච්. ඇම්. මොහිදීන් මහතා
8. යූ. බී. වාමන් මහතා
9. ඇම්. ජේ. සුසපිල්ලේ මහතා
10. ඩින්කර් මුතුක්‍රිෂ්ණ මහතා
11. ඇස්. කනගරත්නම් මහතා
12. ඇස්. ඒ. සී. මූසින් මහතා
13. ඇම්. අයි. එච්. ඇම්. කාසිම් මහතා
14. අබූබකර් ඒ. ඇල්. අද්මානි මහතා

සේවක නියෝජිත සාමාජිකවරු :

1. ඔස්වින් ප්‍රනාන්දු මහතා
2. ඩී. එච්. සමරසේන මහතා
3. පාර්ලිමේන්තු මන්ත්‍රී හර්බට් වික්‍රමසිංහ මහතා
4. ඩී. ඕ. යහම්පත් මහතා
5. ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු මහතා
6. ඇල්. ආර්. ජස්ටින් මහතා
7. ඇස්. සෙල්ලයියා මහතා
8. ඩබ්ලිව්. ඒ. කරුණාදාස මහතා
9. කේ. ඩබ්ලිව්. සුගතදාස මහතා
10. ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා
11. වෝල්ටර් ජෝතිපාල මහතා
12. ඇම්. සී. ඇම්. ෂාෆි මහතා
13. ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
14. ඇම්. ස්ටීවන් ද කෝස්තා මහතා

11-273

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ටයර් හා ටියුබ් සෑදීම, ටයර් නැවත පිරවීම ඇතුළු රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිටි බී. ඇම්. සමරසිංහ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් ඇන්. සරණපාල සිල්වා මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ජී. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ දීය.

11-339

---

ඇල්.ඩී.—බී. 51/53

## රබර් නැවත වගා කිරීමේ ආධාර පනත

### නිවේදනය

1970 අංක 4 දරණ පනතින් සංශෝධිත (437 වැනි අධිකාරය වන) රබර් නැවත වගා කිරීමේ ආධාර පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැවිලි කර්මාන්ත ඇමති, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, මෙම නිවේදනයෙන් මෙහි වූ උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති එක් එක් බෝගය, එම පනතේ කාර්යයන් සඳහා අනුමත බෝගයක් ලෙස ප්‍රකාශ කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| (අ) | පොල් | (උ) | අන්නාසි |
| (ආ) | කොකෝවා | (ඌ) | පැෂන්පෘට් |
| (ඇ) | කරදමුංගු | (එ) | තෘණ |
| (ඈ) | කරාබු | (ඒ) | දූව |
| (ඉ) | සාදික්කා | (ඔ) | තෙල් තල් |
| (ඊ) | ගම්මිරිස් | | |

11–402/1

---

ඇල්.ඩී.—බී. 51/53

## රබර් නැවත වගා කිරීමේ ආධාර පනත

1970 අංක 4 දරණ පනතින් සංශෝධිත (437 වැනි අධිකාරය වන) රබර් නැවත වගා කිරීමේ ආධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා විසින් පනවන ලද නියෝග.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1970 නොවැම්බර් මස 3 වැනි දින.

### නියෝග

1. මෙම නියෝග 1970 රබර් නැවත වගා කිරීමේ ආධාර (අනුමත බෝගවලට විවිධාකරණයේ) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. යම් රබර් ඉඩමක අයිතිකරුවෙකු විසින් එම ඉඩමේ යම් අනුමත බෝග වර්ගයක් නැවත වගා කිරීමේ කාර්යය සඳහා ලිඛිත ඉල්ලීමක් කළ විටෙක මෙම නියෝගවල විධිවිධාන වලට අනුව රබර් පාලක විසින් රබර් නැවත වගා කිරීමේ ආධාර අරමුදලින් ආධාර මුදලක් එම ඉඩම් අයිතිකරු වෙත ගෙවිය හැකිය.

3. 2 වැනි නියෝගය යටතේ ආධාර මුදලක් ඉල්ලුම් කරමින් ඉදිරිපත් කෙරෙන සෑම ඉල්ලුම් පත්‍රයක්ම රබර් පාලක වෙත, ඔහු විසින් එම කාර්යය සඳහා වරින් වර සපයනු ලබන ආකෘති පත්‍රයකම ඉදිරිපත් කළ යුතුය.

4. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා පොල් වගා කෙරෙන විට, එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවෙන ආධාර මුදල රු. 800 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් පහකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රුපියල් 150 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි වැටවල් යොද ආරක්ෂා කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, සහ එහි පොල් පැල සිටුවීම, අවසන් කළ පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 350 බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) පැල සිටුවා නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්මගිය පසුව සහ ආවරණ වගාවන් පිහිටුවීමෙන් අනතුරුව, නැවත වගාකළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 75 ක් බැගින් වූ සිව් වැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 75 බැගින් වූ පස්වැනි වාර මුදල ගෙවිය යුතුය.

5. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා කොකෝවා වගා කෙරෙන විට එසේ වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 1,200 ක් විය යුතු අතර එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් හතකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 250 බැගින් වූ පළමුවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරන බිම් ප්‍රමාණය තුළ පස සංරක්ෂණ ක්‍රම යෙදීම සඳහා සහ එහි කොකෝවා පැල සිටුවීම සඳහා වලවල් හෑරීම අවසන් කළ පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණය තුළ සෙවන දෙන ගස් සිටුවීමෙන් පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකටම රු. 150 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණය තුළ කොකෝවා පැල සිටුවීම අවසන් වූ පසු නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ සිව් වැනි වාර මුදල ගෙවිය යුතුයි.

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ පස්වෙනි වාර මුදල ගෙවිය යුතුයි.

(ඊ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ හය වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(උ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ හත් වෙනි වාර මුදල ගෙවිය යුතුයි.

6. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා කරදමුංගු වගා කෙරෙන විට එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරයක් වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 900 ක් විය යුතු අතර එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් හතරකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් සහ වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසු සහ, එහි සෙවන දෙන ගස් සිටුවීම අවසන් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 400 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණය වැටවල් යොද ආරක්ෂා කිරීම, නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණය තුළ පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, සහ එහි කරදමුංගු පැල සිටුවීම අවසන් කළ පසු, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 300 ක් බැගින් වූ දෙවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසු නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ තුන්වැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ සිව්වැනි වාර මුදල ගෙවිය යුතුය.

7. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා කරාබු ගස් වගා කෙරෙන විට එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවෙන ආධාර මුදල රු. 800 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරින් වාර මුදල් හතරකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් සහ වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසු සහ එහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීම අවසන් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 350 ක් බැගින් වූ පළමුවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි කරාබු පැල සිටුවීම අවසන් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ දෙවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ තුන් වැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ සිව් වැනි වාර මුදල ගෙවිය යුතුය.

8. යම් රබර් ඉඩමක් නැවත වගාව සඳහා සාදික්කා වගා කෙරෙන විට එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවෙන ආධාර මුදල රු. 800 ක් විය යුතු අතර එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් හතරකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසු සහ එහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීම අවසන් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 350 ක් බැගින් වූ පළමුවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි සාදික්කා පැල සිටුවීම අවසන් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ දෙවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ සිව් වෙනි වාර මුදල ගෙවිය යුතුය.

9. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා ගම් මිරිස් වගා කෙරෙන විට එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 900 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් තුනකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති, රබර් සහ වෙනත් වගාවන් සහ වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීම, එම බිම් ප්‍රමාණයෙහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ එහි ගම් මිරිස් පැල සිටුවීම අවසන් කළායින් පසුව නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 500 ක් බැගින් වූ පළමුවැනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

10. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා අන්නාසි වගා කෙරෙන විට, එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවෙන ආධාර මුදල රු. 1,000 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් තුනකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බව ප්‍රමාණයේ ඇති රබර් ගස් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීම, බිම් සකස් කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, වැටවල් යොද ආරක්ෂා කිරීම, සහ අන්නාසි පැල සිටුවීම, අවසන් කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 500 ක් බැගින් වූ පළවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 300 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

11. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා පැෂන්පෘට් වගා කෙරෙන විට එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 1,000 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් හතරකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් හා වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීම, බිම් සකස් කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, වැටවල් යොද ආරක්ෂා කිරීම සහ පැෂන්පෘට් පැල සිටුවීම අවසන් කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 500 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ සෑම එක් එක් අක්කරයකට රු. 150 ක් බැගින් වූ සිව්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

12. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා තෘණ වගාව කෙරෙන විට, එසේ නැවත වගා කෙරෙනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 500 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරින් වාර මුදල් දෙකකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, වැටවල් යොද ආරක්ෂා කිරීම සහ තෘණ වගාව පිහිටුවීම සම්පූර්ණ කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 400 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) තෘණ වගාව පිහිටුවීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

13. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා දුව වගා කෙරෙන විට, එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 600 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් හතරකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ දුව වර්ග වගා කිරීම අවසන් කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 250 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 125 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගාව කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 125 ක් බැගින් වූ තුන් වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු තුනකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ සිව්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

14. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා තෙල් තල් වගා කෙරෙන විට, එසේ නැවත වගා කරනු ලබන එක් එක් අක්කරය වෙනුවෙන් ගෙවන ආධාර මුදල රු. 1,500 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු වාර මුදල් පහකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි ඇති රබර් සහ වෙනත් වගාවන් සහ වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමෙන් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ පළමුවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණය තුළ අවම වශයෙන් අක්කරයකට පැල 55 ක් වත් සිටවෙන සේ රබර් පාලක විසින් අනුමත කරනු ලබන කිසියම් වර්ගයකට හෝ වර්ගවලට අයත් තෙල් තල පැල සිටුවීමෙන් නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ ප්‍රමාණවත් ලෙස පස් සංරක්ෂණ ක්‍රම යෙදීමත්, වැටවල් යොද ආරක්ෂාව සැලසීමත් නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණය

ආවරණය වන සේ පොහොරවැල් වැවීමත් අවසන් කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 500 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට වඩා නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 300 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට වඩා නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 300 ක් බැගින් වූ සිව්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු තුනකට වඩා නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ පස්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

15. යම් රබර් ඉඩමක නැවත වගාව සඳහා අංක 4 ඉහත කී නියෝගවල සඳහන් වන බෝග වර්ග හැර වෙනත් අනුමත බෝග වර්ගයක් යොදගන්නාවිට, එසේ නැවත වගා කරනු ලබන, එක් එක් අක්කරයක් වෙනුවෙන්, ගෙවෙන ආධාර මුදල රු. 500 ක් විය යුතු අතර, එම ආධාර මුදල පහත දක්වෙන අයුරු, වාර මුදල් තුනකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයෙහි ඇති රබර් සහ වෙනත් වගාවන් හා වෘක්ෂලතා ආදිය උදුරා ඉවත් කිරීමත්, පස් සංරක්ෂණ ක්‍රම යෙදීමත්, වැටවල් යොද ඉඩම ආරක්ෂා කිරීමත්, අනුමත බෝග වර්ගයකට අයත් පැල සිටුවා නැවත වගාව අවසන් කිරීමත් සම්පූර්ණ කළායින් පසුව, නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු එකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 200 ක් බැගින් වූ දෙවෙනි වාර මුදල ගෙවිය යුතුය.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් ඉක්ම ගිය පසුව, නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 100 ක් බැගින් වූ තුන්වෙනි වාර මුදල ගෙවිය යුතුය.

16. නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණය එක් අක්කරයකට වඩා අඩුවන අවස්ථාවන්හිදී හෝ, එම බිම් ප්‍රමාණයට අක්කරයකට වඩා අඩු කොටසක් ඇතුළත් වන අවස්ථාවන්හිදී හෝ ඉහත කී නියෝගයන්හි විධිවිධාන වලින් නියමිත ගෙවීම් ප්‍රමාණයත් එම බිම් ප්‍රමාණයට හෝ එහි කොටසකට හෝ එම බිම් ප්‍රමාණයත් හෝ එහි කොටසකත් එක් අක්කරයකුත් අතර ඇති සමානුපාතය අනුව ගණන් බැලූ පදනමක් මත විය යුතුය.

17. යම් රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක අයිතිකරුවෙකුහට ඔහුගේ රබර් වත්ත හෝ කුඩා රබර් ඉඩම කිසියම් අනුමත බෝග වර්ගයක් යොද නැවත වගා කිරීමට අවසර දෙනු ලබන අවස්ථාවන්හිදී එම තැනැත්තා විසින් ආධාර මුදලේ යම් කොටසක් ගෙවනු ලැබීමට පළමුව රබර් පාලක විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කළ යුතුය.

18. කිසියම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකු හට ආධාර මුදලේ පළමුවෙනි වාර මුදල ගෙවා ඇති අවස්ථාවන්හිදී එම තැනැත්තා රබර් පාලක විසින් ලිඛිතව නියම කරනු ලබන කිසියම් කාල සීමාවක් ඇතුළතදී :—

(අ) ආධාර මුදලේ ඊට පසුව එළඹෙන සෑම වාර මුදලක්ම ලබා ගැනීමට සුදුසුවීම සඳහා රබර් පාලක විසින් නියම කරනු ලබන කාර්යයන් සම්පූර්ණ කළ යුතුය.

(ආ) රබර් පාලක විසින් වල් පැලෑටි හෝ වෙනත් වැවිලි ආදිය එවැනි ප්‍රදේශයකින් උදුරා ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කළ යුතුය.

(ඇ) රබර් පාලක විසින් නියම කරනු ලබන අන්දමට එම ප්‍රදේශයෙහි කානු කැපීම හෝ ගල් වැටි තැනීම කළ යුතුය.

(ඈ) රබර් පාලක විසින් නියම කරනු ලබන පරිදි එම ප්‍රදේශයෙහි ආවරණ (පොහොර) වැවිලි වගා කිරීම හෝ සෙවන දෙන ගස් වැවීම හෝ පස සේදී යෑම වලක්වාලීම සඳහා වූ වෙනත් යම් උපක්‍රම යෙදීම කළ යුතුය.

(ඉ) සතුටුදායක ලෙස නොවැඩෙන, නැවත වගා කළ යම් පැල හෝ නැවත වගාව සම්පූර්ණ කිරීමෙන් පසුව, මැරී යන යම් පැල හෝ වෙනුවට වෙනත් පැල සිටුවන ලෙස රබර් පාලක විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කළ යුතුය.

(ඊ) රබර් පාලක විසින් නිකුත් කරනු ලබන නියමයනට අනුකූලව එම ප්‍රදේශයෙහි පොහොර යෙදිය යුතුය.

(උ) එවැනි යම් ප්‍රදේශයක් වටා වැටක් ඉදි කරන ලෙස රබර් පාලක විසින් ඉල්ලා සිටිනු ලැබුව හොත් එසේ වැටක් බැඳිය යුතුය.

19. කිසියම් බිම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබුවා වූ සෑම තැනැත්තෙක්ම රබර් පාලක විසින් ලිඛිතව නියම කරනු ලබන අවම පැල හෝ වැල් සංඛ්‍යාවට නොඅඩු සංඛ්‍යාවක් පිහිටවිය යුතු අතර, නැවත වගා කිරීමට දෙනු ලැබූ බිම් ප්‍රමාණයෙහි එසේ නියමිත අවම පැල හෝ වැල් සංඛ්‍යාව ආධාර මුදලේ අවසාන වාර මුදල ගෙවනු ලබන තෙක්ම වැඩි දුරටත් පවත්වාගෙන යා යුතුය.

20. නැවත වගා කරනු ලැබූ පැල සතුටුදායක ලෙස වැඩීම තහවුරු කිරීමට සහ රෝගී විමුක්තව පැවතීමට අවශ්‍ය යම් කටයුතු වේ නම් ඒවා ඉටු කිරීමත්, නැවත වගාවේදී පිහිටුවන ලද බෝගය යහපත් කෘෂිකාර්මික තත්වයකින් පවත්වාගෙන යාමත් කිසියම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබූ සෑම තැනැත්තෙකු ගේම යුතුකම විය යුතුය.

21. (අ) ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබූ යම් තැනැත්තෙකු 18 වැනි සහ 19 වැනි නියෝගවල කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇති බව හෝ,

(ආ) එබඳු තැනැත්තෙකුගේ නොසැලකිල්ල නිසා හෝ උනන්දුකාරී ප්‍රයත්නයක් නොතිබීම නිසා යම් ප්‍රදේශයක පිහිටුවන ලද පැල හෝ බෝග 20 වැනි නියෝගයෙන් නියමිත අවශ්‍යතාවයන්ට අනුකූලව නොමැති බව රබර් පාලක හට ඒත්තු යන අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ගෙවන ලද ආධාර මුදලෙන් කිසියම් ප්‍රමාණයක් ලියවිල්ල කින් කරනු ලබන දන්වීමක් මගින් එම දන්වීම කරනු ලැබූ සැනකින්ම හෝ එම දන්වීමෙහි නියම කෙරෙන කාල සීමාවක් ඇතුලතදී හෝ ආපසු ගෙවන ලෙස ඔහුට නියම කිරීම රබර් පාලක විසින් කළ හැකි අතර, මෙම නියෝගය යටතේ එවැනි දැනුම්දීමක් කරනු ලැබූ කිසිම තැනැත්තෙකු එම දන්වීමෙන් කරනු ලබන නියමය පැහැරහැරීම නොකළ යුතුය.

22. මෙම නියෝග යටතේ රබර් පාලක වෙත පිරිනැමෙන හෝ, නියම කෙරෙන හෝ පැවරෙන හෝ කිසියම් බලතල, යුතුකම් හෝ කාර්යයන් ඉටු කිරීම, රබර් පාලන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකු හට පැවරීම රබර් පාලක විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් කළ හැකිය. එතෙකුදු වුවත් මෙම නියෝගය යටතේ බලතල පැවරීමේ බලය වෙනත් නිලධාරියෙකු හට පැවරීම රබර් පාලකට කළ නොහැකිය.

23. (අ) මෙහි 17, 18, 19, 20, හෝ 21 වැනි නියෝගවල විධිවිධානයන් උල්ලංඝනය කරන්නාවූ හෝ

(ආ) මෙම නියෝග යටතේ වූ කිසියම් ඉල්ලුම් පත්‍රයක හෝ ප්‍රකාශයක යම්කිසි කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බවට තමන් දන්නා යම් ප්‍රකාශයක් කරන්නාවූ හෝ,

(ඇ) ආධාර මුදලක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවෙකු වශයෙන් හෝ ආධාර මුදලක් ලබාගන්නා අයෙකු වශයෙන් හෝ රබර් පාලක හට අසත්‍ය තොරතුරු සපයන්නාවූ, සෑම තැනැත්තෙක්ම දඬුවම් ලැබිය යුතු වරදකරුවෙකු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු විභාගයකින් පසුව, වැරදිකරුයයි තීරණය කරනු ලැබුවහොත්, රු. 1,000කට නොවැඩි වන්නා වූ දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව නියම කෙරෙන්නාවූ හය මාසයකට නොවැඩි සිර දඬුවමකට හෝ, එවැනි දඩයක් සහ සිර දඬුවමක් යන දෙකටම හෝ යටත් විය යුතුය.

24. මෙම නියෝගවල. 'පනත' යන්නෙන් පසුව සංශෝධිත පරිදි වූ (437 වැනි අධිකාරය වන) රබර් නැවත වගා කිරීමේ ආධාර පනත අදහස්වේ. වත්තක් හෝ කුඩා ඉඩමක් සම්බන්ධයෙන් 'අයිතිකරු' යන්නෙන් (436 වැනි අධිකාරය වන) රබර් පාලන පනතේ විධිවිධානයන් යටතේ එම ඉඩමේ අයිතිකරු වශයෙන් ලියාපදිංචිව ඇත්තාවූ හෝ ලියාපදිංචි වී ඇතැයි සැල කෙන්නාවූ තැනැත්තෙකු අදහස්වේ.

'රබර් වත්ත' යන්නෙන් ඊට පනතෙහි යෙදෙන අර්ථයම අදහස් වන අතර 'කුඩා රබර් ඉඩම' යන්නෙන්ද පනතෙහි ඊට යෙදෙන අර්ථයම අදහස් වේ.

'රබර් ඉඩම' යන්නෙන් යම් රබර් වත්තක් හෝ කුඩා රබර් ඉඩමක් අදහස් වේ.

11–402/2

---

ඇල්.ඩී.—බී. 14/58

## 1958 අංක 12 දරන තේ ආධාර පනත

### නිවේදනය

1961 අංක 66 දරන පනතින් සහ 1970 අංක 4 දරන පනතින් සංශෝධිත, 1958 අංක 12 දරන තේ ආධාර පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැවිලි කර්මාන්ත ඇමති, ආචාර්ය කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, මෙම නිවේදනයෙන්, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති එක් එක් බෝගය, එකී පනතේ කාර්යයන් සඳහා අනුමත බෝගයක් සේ ප්‍රකාශ කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති,

1970 නොවැම්බර් 3 දින,
කොළඹ දීය.

උපලේඛනය

(අ) පොල්
(ආ) කොකෝවා
(ඇ) කරදමුංගු
(ඈ) කරාබු
(ඉ) සාදික්කා
(ඊ) ගම්මිරිස්
(උ) අන්නාසි
(ඌ) පැෂන් ෆෲට්
(එ) තණ
(ඒ) දුව
(ඔ) රබර්

11—403/1

---

ඇල්.ඩී.—බී. 14/58

## 1958 අංක 12 දරන තේ ආධාර පනත

1961 අංක 66 දරන පනතින් ද, 1966 අංක 33 දරන පනතින්ද, 1970 අංක 4 දරන පනතින් ද සංශෝධිත 1958 අංක 12 දරන තේ ආධාර පනතේ 10 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා විසින් පනවන ලද නියෝග.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1970 නොවැම්බර් 3 දින,
කොළඹ දිය.

### නියෝග

1. මෙම නියෝග, 1970 තේ ආධාර (අනුමත කළ බෝගයන්ට විවිධකරණයේ) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. යම් තේ වත්තක හෝ කුඩා තේ ඉඩමක අයිතිකරුවෙකු විසින් එම වත්තේ හෝ කුඩා තේ ඉඩමේ අනුමත බෝග වර්ගයක් නැවත වගා කිරීමේ ආධාර සඳහා ලිඛිත ඉල්ලීමක් කළහොත්, මෙම නියෝගවල විධිවිධාන අනුව තේ පාලක විසින් තේ ආධාර අරමුදලෙන් ආධාර මුදලක් එම කාර්යය සඳහා එම ඉඩම් අයිතිකරුට ගෙවිය හැක්ය.

3. 2 වැනි නියෝගය යටතේ ආධාර මුදලක් ඉල්ලුම්කරමින් ඉදිරිපත් කෙරෙන සෑම ඉල්ලුම් පත්‍රයක්ම තේ පාලක විසින් එම කාර්යය සඳහා වරින් වර සපයනු ලබන ආකෘති පත්‍රයක ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය.

4. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් පොල් යොද නැවත වගාකරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 800 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් පහකින් ගෙවිය යුතුය :—

(අ) වැටවල් බැඳීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ පොල් පැල යොද නැවත වගා කිරීම අවසන් කළාට පසුව, නැවත වගාකිරීමට ඇති බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 400 බැගින් වන පළමු වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) පොල් සිටවූ වළවල් වටේ අඩි 6 ක ප්‍රමාණයේ ඇති තේ පඳුරු උදුරා ඉවත්කිරීම අවසන් කළවිට, නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව එක් එක් අක්කරයට රු. 100 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය :

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 75 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 75 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඉ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව සහ ඉතිරි තේ පඳුරු උදුරා ඉවත් කළ විට, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන පස්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

5. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් කොකෝවා යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 1,200 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි දැනට ඇති තේ පැළ උදුරා දැමීමෙන් පසුව, එම බිම් ප්‍රමාණයෙහි එක් එක් අක්කරයකට රු. 250 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් පසුව සහ කොකෝවා පැළ සඳහා වළවල් හෑරීම අවසන් කළාට පසුව එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි සෙවන දෙන ගස් සිටුවීමෙන් පසුව එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන තුන්වෙනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) කොකෝවා පැළ යොද නැවත වගාකිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන හතරවෙනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඉ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන පස්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඊ) නැවත වගා කිරීම සම්පූර්ණකර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන හයවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(උ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක්එක් අක්කරයකට රු. 150 බැගින් වන හත්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

6. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් කරදමුංගු යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 900 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) තේ පාලක වරයා සෑහීමට පත්වන පරිදි අළුත් බෝගය සිටුවනු ලබන ස්ථානයන්හි හා ඒ අවට ඇති තේ පැළ උදුරා දැමීමෙන් පසුව සහ නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි සෙවන දෙන ගස් සිටුවීමෙන් පසුව, එම බිම් ප්‍රමාණයෙහි එක් එක් අක්කරයකට රු. 400 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ කරදමුංගු පැල යොද නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව සහ ඉතිරිව ඇති තේ පැළ වෙතොත් ඒවා ඉවත් කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

7. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් කරාබු යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 800 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) තේ පාලක වරයා සෑහීමට පත් වන පරිදි කරාබු සිටුවනු ලබන ස්ථානයන්හි හා ඒ අවට ඇති තේ පැළ උදුරා දැමීමෙන් පසුව සහ නැවත වගාකිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 350 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) කරාබු පැළ යොද නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව සහ ඉතිරිව ඇති තේ පැළවෙතොත් ඒවා ඉවත් කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය;

8. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් සාදික්කා යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 800 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) තේ පාලකවරයා සෑහීමට පත්වන පරිදි සාදික්කා සිටවනු ලබන ස්ථානයන්හි හා ඒ අවට ඇති තේ පැළ උදුරා දැමීමෙන් සහ නැවත වගාකිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 350 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) සාදික්කා පැළ යොද නැවත වගාකිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව සහ ඉතිරිව ඇති තේ පැළ වෙතොත් ඒවා ඉවත් කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

9. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් ගම්මිරිස් යොද නැවත වගා කරනු ලැබීම සඳහා, ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 900 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් තුනකින් ගෙවිය යුතුය :—

(අ) තේ පාලකවරයා සෑහීමට පත් වන පරිදි අළුත් බෝගය සිටුවනු ලබන ස්ථානයන්හි හා ඒ අවට ඇති තේ පැල උදුරා දැමීමෙන් සහ නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස් සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 500 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) ගම්මිරිස් වැල් යොද නැවත වගාකිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, සහ ඉතිරිව ඇති තේ පැල ඇතොත් ඒවා ඉවත් කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන තුන්වන ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

10. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් අන්නාසි යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 1,000ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් තුනකින් ගෙවිය යුතුය :—

(අ) දැනට ඇති තේ පැල උදුරා දැමීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, ඉඩම පිළියෙල කිරීම සහ අන්නාසි යොද නැවත වගාකිරීම සම්පූර්ණ කළාට පසුව, එක් එක් අක්කරයකට රු. 500 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

11. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් පැෂන් ෆෘට් යොද නැවත වගා කරනු ලැබීම සඳහා එක් එක් අක්කරයකට ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 1,000 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) දැනට ඇති තේ පැළ උදුරා දැමීම, ඉඩම පිළියෙල කිරීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ පැෂන් ෆෘට් යොද නැවත වගාකිරීම සම්පූර්ණ කළාට පසුව, එක් එක් අක්කරයකට රු. 500 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය : සහ

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 150 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

12. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් තෘණ යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 500 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් දෙකකින් ගෙවිය යුතුයි :—

(අ) දැනට ඇති තේ පැල උදුරා දැමීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම, වැටවල් බැඳීම සහ තෘණ සිටුවීම සම්පූර්ණ කළාට පසුව, එක් එක් අක්කර යටක රු. 400 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) තෘණ සිටුවීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

13. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් පයිනස් දව හැර වෙනත් දව වර්ග යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය, එසේ නැවතවගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 600 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) දැනට ඇති තේ පැල උදුරා දැමීම, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ දව වර්ග යොද නැවත වගාකිරීම සම්පූර්ණ කළාට පසුව, එක් එක් අක්කරයකට රු. 250 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 125 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත් වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 125 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ; සහ

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

14. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් පයිනස් දව යොද නැවත වගාකරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය, එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 600 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් හතරකින් ගෙවිය යුතුය :—

(අ) දැනට ඇති තේ පැල උදුරා දැමීමෙන් හෝ පයිනස් වගාකිරීමට නියමිත බිම් තීරු දිගේ ඇති තේ පැළ උදුරා දැමීමෙන් පසුව, පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ දව යොද නැවත වගාකිරීම සම්පූර්ණ කළාට පසුව, එක් එක් අක්කරයකට රු. 250 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු.125 බැගින් වන වන දෙවන ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) සියළුම තේ පැළ උදුරා දැමීමෙන් පසුව සහ නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 125 බැගින් වන තුන්වන ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 100 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොට ගෙවිය යුතුය.

15. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් රබර් යොද නැවත වගා කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයට රු. 1,400 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් අන්දමට කොටස් පහකින් ගෙවිය යුතුය :—

(අ) නැවත වගාකිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි තිබෙන තේ පැළ සහ වෙනත් වගාවන් උදුරා දැමීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 200 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) පස් සංරක්ෂණ ක්‍රම යෙදීම සහ බද්ධ රබර් පැළ හෝ ක්ලෝනල් ඇට පැළ යොද නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීමට සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඈ) නැවත වගාකිරීම සම්පූර්ණකර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන හතරවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඉ) නැවත වගාකිරීමට සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයකට රු. 300 බැගින් වන පස්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

16. යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් ඉහතකී නියෝගයන්හි නිශ්චිතව සඳහන් යම් අනුමත භෝගයක් හැර වෙනත් අනුමත කළ භෝග යක් යොද නැවත වගාකිරීම සඳහා ගෙවිය යුතු ආධාර මුදල් ප්‍රමාණය එසේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 500 ක් විය යුතු අතර, එම මුදල් පහත සඳහන් අන්දමට කොටස් තුනකින් ගෙවිය යුතුය.

(අ) නැවත වගාකිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි තිබෙන තේ පැල උදුරා දැමීමෙන් පසුව සහ පස් සංරක්ෂණ ක්‍රමයෙදීමෙන් පසුව, එක් එක් අක්කරයට රු. 200 බැගින් වන පළමුවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ආ) අනුමත කළ බෝගය යොද නැවත වගාකිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, එක් එක් අක්කරයට රු. 200 බැගින් වන දෙවැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය ;

(ඇ) නැවත වගාකිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ඉකුත්වූවාට පසුව, එක් එක් අක්කරයට රු. 100 බැගින් වන තුන්වැනි ආධාර මුදල් කොටස ගෙවිය යුතුය.

17. නැවත වගා කෙරෙන බිම් ප්‍රමාණය එක් අක්කරයකට වඩා අඩුවන අවස්ථාවන්හිදී හෝ, එම බිම් ප්‍රමාණයට අක්කරයකට වඩා අඩු කොටසක් ඇතුලත් වන අවස්ථාවන් හිදී ඉහත සඳහන් නියෝගයන්හි විධිවිධාන වලින් නියමිත ගෙවීම් ප්‍රමාණයන් එම බිම් ප්‍රමාණයට හෝ එහි කොටසකට එම බිම් ප්‍රමාණයත් හෝ එහි කොටසකත් එක් අක්කරයකත් අතර ඇති සමානුපාතය අනුව ගණන් බැලූ පදනමක් මත අදාළ විය යුතුය.

18. යම් තේ වත්තක හෝ කුඩා තේ ඉඩමක අයිතිකරුවෙකුහට ඔහුගේ තේ වත්ත හෝ කුඩා ඉඩම කිසියම් අනුමත බෝග වර්ගයකින් නැවත වගාකිරීමට අවසර දෙනු ලබන අවස්ථාවන්හිදී, එම පුද්ගලයාට යම් ආධාර මුදල් කොටසක් ගෙවීමට පළමුව, තේ පාලක විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන අවශ්‍යතාවයනට අනුකූලව එම පුද්ගලයා කටයුතු කළ යුතුය.

19. මෙම නියෝග යටතේ නැවත වගා කෙරෙන කිසියම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුහට ආධාර මුදලේ පළමුවැනි වාර මුදල ගෙවා ඇති අවස්ථාවන්හි දී, එම පුද්ගලයා තේ පාලක විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන කිසියම් නිශ්චිත කාලසීමාවක් ඇතුළතදී :—

(අ) ආධාර මුදලේ ඊට පසුව යෙදෙන සෑම වාර මුදලක්ම ලබාගැනීමට සුදුසුවීම සඳහා තේ පාලක විසින් නියම කරනු ලබන කාර්‍යයන් සම්පූර්ණ කළ යුතුය ;

(ආ) තේ පාලක විසින් වල් පැලෑටි හෝ වෙනත් වැවිලි ආදිය එවැනි බිම් ප්‍රමාණයකින් උදුරා ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුව හොත් එසේ කළ යුතුය ;

(ඇ) තේ පාලක විසින් නියම කරනු ලබන අන්දමට එම බිම් ප්‍රමාණයෙහි කානු කැපීම හෝ ගල්වැටි තැනීම කළ යුතුය ;

(ඈ) තේ පාලක විසින් නියම කරනු ලබන පරිදි එම බිම් ප්‍රමාණයෙහි ආවරණ වැවිලි වගා කිරීම හෝ සෙවන ගස් වැවීම හෝ පස සේදීයෑම වලක්වාලීම සඳහා වූ වෙනත් යම් උපක්‍රම යෙදීමත් කළ යුතුය ;

(ඉ) සතුටුදායක ලෙස නොවැඩෙන, නැවත වගා කල යම් පැල හෝ නැවත වගාව සම්පූර්ණ කිරීමෙන් පසුව මැරී යන යම් පැල හෝ වෙනුවට වෙනත් පැල සිටුවන ලෙස තේ පාලක විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කළයුතුය ;

(ඊ) තේ පාලක විසින් නිකුත් කරනු ලබන නියමයනට අනුකූලව එම බිම් ප්‍රමාණයෙහි පොහොර යෙදිය යුතුය ;

(උ) එවැනි යම් බිම් ප්‍රමාණයක් වටා වැටක් ඉදි කරන ලෙස තේ පාලක විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ වැටක් බැඳිය යුතුය.

20. නැවත වගා කෙරෙන කිසියම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබුවාවූ සෑම පුද්ගල යෙකුම, තේ පාලක විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන අඩුම පැල හෝ වැල් සංඛ්‍යාවට නොඅඩු සංඛ්‍යාවක් පිහිටුවිය යුතු අතර, නැවත වගා කිරීමට අවසර දෙනු ලැබූ බිම් ප්‍රමාණයෙහි එසේ නියමිත අඩුම පැල හෝ වැල් සංඛ්‍යාව ආධාර මුදලේ අවසාන වාර මුදල ගෙවනු ලබනතෙක්ම වැඩිදුරටත් පවත්වාගෙන යායුතුය.

21. නැවත වගා කරනු ලැබූ පැල හෝ වැල් සතුටුදායක ලෙස වැඩීම තහවුරු කිරීමට සහ රෝගවලින් විමුක්තව පැවතීමට අවශ්‍ය යම් කටයුතු වේ නම් ඒවා ඉටුකිරීමත්, නැවත වගාවේදී පිහිටුවන ලද භෝගය යහපත් කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වා ගෙන යාමත්, නැවත වගා කෙරෙන කිසියම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබූ සෑම පුද්ගලයකුගේම යුතුකම විය යුතුය.

22. (අ) ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබූ යම් පුද්ගලයකු 19 වැනි හෝ 20 වැනි නියෝගවල කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇති බව ; හෝ

(ආ) එබඳු යම් පුද්ගලයකුගේ නොසැලකිලිමත්කම හෝ උනන්දුකාරී ප්‍රයත්නයක් නොතිබීම හේතුකොටගෙන නැවත වගා කරන ලද යම් බිම් ප්‍රමාණයක පිහිටුවන ලද පැල හෝ භෝග 21 වැනි නියෝගයෙන් නියමිත අවශ්‍යතාවයන්ට අනුකූල නොමැති බව ; හෝ තේ පාලකහට ඒත්තු යන අවස්ථාවන්හි දී :—

එම බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඒ පුද්ගලයාහට ගෙවන ලද ආධාර මුදලෙන් කිසියම් ප්‍රමාණයක් ලියවිල්ලකින් කරනු ලබන දැන්වීමක් මගින් එම දැන්වීම කරනු ලැබූ සැනකින්ම හෝ එම දැන්වීමෙහි නියම කෙරෙන කාලසීමාවන් ඇතුළතදී හෝ ආපසු ගෙවන ලෙස ඔහුට නියම කිරීම තේ පාලකහට කළ හැකි අතර, මෙම නියෝගය යටතේ එවැනි දැනුම්දීමක් කරනු ලැබූ කිසිම පුද්ගලයෙකු එම දැන්වීමෙන් කරනු ලබන නියමය පැහැර හැරීම නොකළ යුතුය.

23. තේ පාලකට තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් මෙම නියෝගයන් යටතේ තේ පාලක වෙත පිරිනැමෙන හෝ, නියම කෙරෙන හෝ, පැවරෙන හෝ, කිසියම් බලතල, යුතුකම්, හෝ කාර්යයන් පාවිච්චි කිරීමට ක්‍රියාවේ යෙදවීමට හා ඉටුකිරීමට තේ පාලන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුහට බලය පැවරිය හැකිය.

24. (අ) මෙහි 18 වැනි, 19 වැනි, 20 වැනි, 21 වැනි හෝ 22 වැනි නියෝගවල විධිවිධානයන් උල්ලංඝණය කරන්නාවූ, හෝ

(ආ) මෙම නියෝග යටතේ වූ කිසියම් ඉල්ලුම් පත්‍රයක ප්‍රකාශයක, යම්කිසි කරුණක් හෝ විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය බවට තමන් දන්නා යම් ප්‍රකාශයක් කරන්නාවූ, හෝ

(ඇ) ආධාර මුදලක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවෙකු වශයෙන් හෝ ආධාර මුදලක් ලබාගන්නා අයෙකු වශයෙන් හෝ, තේ පාලකහට අසත්‍ය තොරතුරු සපයන්නාවූ ;

සෑම පුද්ගලයෙකුම දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වැරදිකරු යයි තීරණය කරනු ලැබුවහොත් රු. 1,000 කට නොවැඩි වන්නාවූ දඩයකට හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව නියම කෙරෙන්නාවූ හය මාසයකට නොවැඩි සිරදඬුවමකට හෝ, එවැනි දඩයක් සහ සිර දඬුවමක් යන දෙකටම හෝ යටත්විය හැකි වන්නේය.

11–403/2

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂා වන්ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් හේවාගල්ල ගේ තිලකනන්ද ගුණරත්න මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥාපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1968 ක්වූ ජූලි මස 11 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දිය.

11-328

---

අංකය : ඊ. 23/ඍ/508/69.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4. (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් කඳානේ රොමොල් මාවතේ, පල්ලිය වත්තේ අංක 17හි ඒ. ජේ. ඕර්ලෝෆ් මහතා හා කඳානේ, පල්ලිය පාර අසල, ශාන්ත ජෝශප් මාවතේ අංක 19හි එල්. ඊ. පී. ගුණවර්ධන මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන්. ජා-ඇල, මිනුවන්ගොඩ පාර, ඔටොමොබයිල් ප්‍රොඩක්ට්ස් (සිලෝන්) ලිමිටඩ් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 8, කාසල් වීදියේ, අංක 341/1 හි එස්. එස්. විජේරත්න මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ඔක්තෝබර් මස 30 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන් කඳානේ, රොමෝල් මාවතේ, පල්ලිය වත්තේ, අංක 17හි ඒ. ජේ. ඕර්ලෝෆ් මහතා හා කඳානේ පල්ලිය පාර අසල ශාන්ත ජෝශප් මාවතේ අංක 19හි එල්. ඊ. පී. ගුණවර්ධන මහතා

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්, ජා-ඇල මිනුවන්ගොඩ පාර, ඔටෝමෝබයිල් ප්‍රොඩක්ට්ස් (සිලෝන්) ලිමිටඩ්

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුල නම් :—

ඔටොමොබයිල් ප්‍රොඩක්ට්ස් (සිලෝන්) ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් ඒ. ජේ. ඕර්ලෝෆ් මහතා සහ එල්. ඊ. වී. ගුණවර්ධන මහතා සේවයෙන් පහකිරීම යුක්ති සහගතද, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් පිළිබඳව වේ.

1970 ඔක්තෝබර් මස 23 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

11-269

අංකය : සී/අයි 1013

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් තේ, රබර් හා මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 හා පෙරෙයිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්, තැ.පෙ. 691,—75, යෝර්ක් විදිය, කොළඹ 1. අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970, නොවැම්බර් මස 3 වැනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක්සත් තේ, රබර් හා මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය,
71, මැලේ විදිය, කොළඹ 2.

සහ

පෙරෙයිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්,
තැ.පෙ. 691—75, යෝර්ක් විදිය,
කොළඹ 1.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් :—

පෙරෙයිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්හි ව්‍යාපාර කටයුතු වසා දැමීම නිසා ඉහත සඳහන් වෘත්තීය සමිතියේ සාමාජිකයන් වන පහත නම් සඳහන් සේවකයන් පාරිතෝෂික දීමනා සහ වන්දි ඉල්ලා සිටීම යුක්ති සහගතද යන්නත්, එසේනම් ඔවුන් එකිනෙකාට කුමන පාරිතෝෂික දීමනා ප්‍රමාණයක් සහ/හෝ වන්දි ප්‍රමාණයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

## උපලේඛනය

| අංකය | ටී. අංකය | නම |
|---|---|---|
| 1 | 3 | ඒ. ආර්. කාදර් සායිබු |
| 2 | 8 | ඩබ්ලිව්. මොහමඩ් |
| 3 | 9 | කේ. ජී. ජේම්ස් අප්පු |
| 4 | 10 | කේ. ඒල්. ජේම්ස් අප්පු |
| 5 | 12 | ආර්. ඒ. ලීලාවතී |
| 6 | 13 | බී. ආරියවතී |
| 7 | 15 | එම්. සිසිලිහාමි |
| 8 | 16 | එම්. ඒ. එමලින්හාමි |
| 9 | 18 | බී. සොපිහාමි |
| 10 | 19 | එම්. කොර්නෙලිහාමි |
| 11 | 20 | ජී. ඩබ්ලිව්. ඒ. රන්මැණිකා |
| 12 | 32 | එස්. ඒ. කාදර් |
| 13 | 33 | ඩී. එච්. කරුණාරත්න |
| 14 | 35 | ආර්. නඩරාජා |
| 15 | 41 | එන්. ඒ. පී. ජයවර්ධන |
| 16 | 45 | එච්. ජෝකින් සිල්වා |
| 17 | 50 | තුවන් සායිබඩීන් |
| 18 | 51 | එච්. ඒ. කැරොලින් නෝනා |
| 19 | 53 | ජී. කේ. ඇලිස්නෝනා |
| 20 | 54 | එම්. පෙරේරා මැණිකා |
| 21 | 55 | ඒ. ඒ. ඇලන්නෝනා |
| 22 | 57 | එම්. ගුණවතී පීරිස් |
| 23 | 59 | ඩබ්ලිව්. ඒ. කල්‍යාණවතී |
| 24 | 61 | කේ. වී. සුමනාවතී |
| 25 | 63 | එල්. කේ. ඇක්ලින් නෝනා |
| 26 | 64 | ඩබ්ලිව්. ඒ. රොස්ලින් නෝනා |
| 27 | 65 | පී. මිලිනෝනා |
| 28 | 67 | එච්. එල්. ප්‍රේමවතී |
| 29 | 69 | ජී. ඇස්ලින් නෝනා |
| 30 | 71 | බී. එම්. වාලට් නෝනා |
| 31 | 76 | එච්. ජී. සෝමා රණසිංහ |
| 32 | 79 | කේ. එම්. ඩබ්ලිව්. පොසිනෝනා |
| 33 | 85 | ඩබ්ලිව්. මුදියන්සේ |
| 34 | 87 | ටී. ජේ. සිරිපාල |
| 35 | 88 | ඩබ්ලිව්. ඒ. සෝමචන්ද්‍ර |
| 36 | 89 | එම්. විමලාවතී පෙරේරා |
| 37 | 91 | ඩී. ඒ. සෝමාවතී |
| 38 | 94 | එම්. එම්. මොහමඩ් |
| 39 | 96 | එච්. ඩී. ජිනදාස |
| 40 | 100 | ඩබ්ලිව්. ඒ. මාලිනී |
| 41 | 101 | සිත්ති අලිමා |
| 42 | 104 | එම්. විමලාවතී සිල්වා |
| 43 | 106 | එන්. ගුණරත්න |
| 44 | 107 | එම්. ඒ. ජයතිස්ස |
| 45 | 109 | එම්. ලfපීර් |
| 46 | 114 | ඩබ්. එම්. ජොසිනෝනා |
| 47 | 115 | ඩී. කේ. ඇග්නස්නෝනා |
| 48 | 118 | ඒ. ඩබ්ලිව්. වයලට් |
| 49 | 120 | කේ. කේ. නන්දවතී |
| 50 | 121 | ටී. ජී. චන්ද්‍රාවතී |
| 51 | 122 | එච්. පී. සීතා |
| 52 | 125 | ඩබ්ලිව්. ඒ. ඥාණවතී |
| 53 | 126 | ඩබ්ලිව්. ඥාණවතී |
| 54 | 127 | එස්. ඒ. සෝමාවතී |
| 55 | 130 | කේ. බේබිනෝනා |
| 56 | 132 | බී. එම්. ආරියවතී |
| 57 | 133 | එල්. පී. කැරොලිනා නෝනා |
| 58 | 137 | එච්. එම්. ඩිස්ලින්නෝනා |
| 59 | 138 | කේ. ඇසිලින් නෝනා |
| 60 | 139 | එස්. ඒ. සීලවතී |
| 61 | 140 | එච්. එම්. සොමලින් නෝනා |
| 62 | 141 | එච්. ඒ. ඇග්නස් නෝනා |
| 63 | 142 | ඩී. එච්. ලීලාවතී |
| 64 | 145 | ඩබ්ලිව්. එම්. මේරිනෝනා |
| 65 | 146 | එස්. ඩී. සෝමාවතී |
| 66 | 147 | ඩී. එම්. පොඩිහාමිනේ |
| 67 | 151 | බී. එම්. වාලට් නෝනා |
| 68 | 153 | ඒ. එල්. මේරි නෝනා |
| 69 | 161 | එච්. එම්. සෝමාවතී |
| 70 | 165 | ඇග්නස් යටවර |
| 71 | 166 | එම්. ජී. වයලට් |
| 72 | 167 | එම්. ඒ. ඇයිලින් නෝනා |
| 73 | 168 | එස්. එච්. ඇසිලින් |
| 74 | 169 | ජේ. ඒ. සුමනාවතී |
| 75 | 170 | ඒ. බී. ජේන්නෝනා |
| 76 | 172 | ඒ. ඩී. සීලවති |
| 77 | 173 | ජී. ඒ. ඩී. මියුරියල් |
| 78 | 174 | ඒ. ඒ. ලිලිනෝනා |
| 79 | 175 | බී. ඒ. යෝමාවතී |
| 80 | 180 | ඩී. ඒ. එමලින්නෝනා |
| 81 | 184 | එම්. ලිලිනෝනා |
| 82 | 190 | ටී. ඒ. විමලාවතී |
| 83 | 191 | ධර්මසිලි සිල්වා |
| 84 | 192 | බී. ගුණවතී |
| 85 | 193 | කරුණා ජයසිංහ |
| 86 | 194 | කේ. එම්. බේබිනෝනා |
| 87 | 197 | ඩබ්ලිව්. කරුණාවතී |
| 88 | 198 | එම්. ඒ. මියුරින් නෝනා |
| 89 | 204 | සී. එම්. නිසාර් |
| 90 | 206 | එස්. සෝමදාස |
| 91 | 208 | ඒ. ඇම්බ්‍රෝස් |
| 92 | 209 | කේ. පියසේන |
| 93 | 210 | එෆ්. ටී. සම්සුඩීන් |
| 94 | 211 | ඊ. ඇන්තනි |
| 95 | 213 | කේ. මුතුසාමි |
| 96 | 214 | ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු |
| 97 | 215 | ඩී. ජී. ජිනදාස |
| 98 | 216 | එච්. එම්. බෙලින් |
| 99 | 217 | එම්. ඉසෙඩ්. එම්. fපරිඩ් |
| 100 | 218 | එම්. පියදාස |

| අංකය | | ටී. අංකය | | නම |
|---|---|---|---|---|
| 101 | ... | 219 | ... | කේ. ඒ. ලයනල් පෙරේරා |
| 102 | ... | 220 | ... | ටී. ධර්මදාස සිල්වා |
| 103 | ... | 221 | ... | එච්. එම්. විජේදාස |
| 104 | ... | 222 | ... | ඕ. සුමනදාස |
| 105 | ... | 223 | ... | ජේ. සිරිසේන |
| 106 | ... | 224 | ... | ඩබ්ලිව්. ඩී. එලාරිස් |
| 107 | ... | 225 | ... | ආර්. සුගතදාස |
| 108 | ... | 226 | ... | ඩබ්ලිව්. ඩී. වාරිස් |
| 109 | ... | 227 | ... | එච්. ඒ. මියුරින් නෝනා |
| 110 | ... | 228 | ... | එච්. ඥණවතී |
| 111 | ... | 229 | ... | ඩී. ඉවුජින් සිල්වා |
| 112 | ... | 230 | ... | බී. ජොයිනෝනා |
| 113 | ... | 231 | ... | ඩබ්ලිව්. ඩී. ඇස්ලින් නෝනා |
| 114 | ... | 232 | ... | කේ. ඩබ්. එෆ්. ප්‍රේමවතී සොයිසා |
| 115 | ... | 233 | ... | ඒ. මාග්‍රට් පෙරේරා |
| 116 | ... | 234 | ... | එච්. ආර්. සීලවතී |
| 117 | ... | 235 | ... | ඩී. මේරි එච්. ෆ්‍රැන්සිස් |
| 118 | ... | 236 | ... | එස්. ජෙයිනූ |
| 119 | ... | 237 | ... | ඩබ්ලිව්. ඒ. වීරසිංහ |
| 120 | ... | 238 | ... | පී. දයාවතී |
| 121 | ... | 239 | ... | සිත්ති ජයිනූර් |
| 122 | ... | 240 | ... | එස්. කාලියම්මා |
| 123 | ... | 241 | ... | කේ. ඩී. ජී. මාලිනී |
| 124 | ... | 242 | ... | එච්. ඒ. එමානෝනා |
| 125 | ... | 243 | ... | ජී. එම්. එලිසහාමි |
| 126 | ... | 244 | ... | පී. එච්. බේබිනෝනා |
| 127 | ... | 245 | ... | එස්. ස්වර්ණලතා ප්‍රනාන්දු |
| 128 | ... | 246 | ... | ඩී. එමලින් සිල්වා |
| 129 | ... | 247 | ... | කේ. කුසුමාවතී ගෝමස් |
| 130 | ... | 248 | ... | එම්. චන්ද්‍රාවතී |
| 131 | ... | 249 | ... | කේ. ඩී. ප්‍රේමවතී |
| 132 | ... | 250 | ... | එම්. කේ. කේ. සෝමාවතී |
| 133 | ... | 251 | ... | බී. එච්. ඩී. සීලවතී අල්විස් |
| 134 | ... | 252 | ... | එන්. හද්‍රකාලි |
| 135 | ... | 253 | ... | එච්. සොපිහාමි |
| 136 | ... | 254 | ... | එම්. ඒ. රොසිද නෝනා |
| 137 | ... | 255 | ... | ඒ. එම්. අයිරින් |
| 138 | ... | 256 | ... | ඩබ්ලිව්. ජී. කරුණාවතී |
| 139 | ... | 257 | ... | ආර්. එම්. සෝමපාල |
| 140 | ... | 258 | ... | කේ. එම්. ගුණදාස |
| 141 | ... | 259 | ... | එස්. ඒ. බන්දුසේන |
| 142 | ... | 260 | ... | එන්. කේ. සිරිසේන |
| 143 | ... | 261 | ... | ටී. ඩී. සමරපාල |
| 144 | ... | 262 | ... | මැගිලින් සිල්වෙස්ටර් |
| 145 | ... | 17 | ... | එච්. ඒ. ඇලන්නෝනා |
| 146 | ... | 30 | ... | ඒ. ඩී. චන්ද්‍රාවතී |
| 147 | ... | 34 | ... | යූ. පී. ගුණතිලක |
| 148 | ... | 37 | ... | බී. ඩී. සෝමරත්න |
| 149 | ... | 38 | ... | කේ. පේද්‍රික් |
| 150 | ... | 36 | ... | ඩී. එච්. ඇල්බට් |
| 151 | ... | 58 | ... | ඩබ්ලිව්. ඒ. සිරියාවතී |
| 152 | ... | 62 | ... | මේබල් රාජපක්ෂ |
| 153 | ... | 74 | ... | මේබල් රූපසිංහ |
| 154 | ... | 95 | ... | බී. ඩී. විල්සන් |
| 155 | ... | 97 | ... | ඩබ්ලිව්. ඒ. හේරත් සිංඤ්ඤෝ |
| 156 | ... | 108 | ... | එම්. එම්. නිස්ශංක |
| 157 | ... | 129 | ... | කුසුමාවතී |
| 158 | ... | 178 | ... | එච්. ඒ. වයලට් නෝනා |
| 159 | ... | 212 | ... | යූ. ඊටින් |
| 160 | ... | — | ... | එච්. ඒ. පෙර්රා |
| 161 | ... | — | ... | බී. ජේම්ස් පෙරේරා |
| 162 | ... | — | ... | ඩී. පවුලිස් අප්පුහාමි |
| 163 | ... | — | ... | ඩී. එම්. විජේසිංහ |
| 164 | ... | — | ... | ඒ. ඩී. එම්. ධර්මසේන |
| 165 | ... | — | ... | ලෙස්ලි විජේසිංහ |

1970 නොවැම්බර් මස 3 වැනිද වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස් ගේ කාර්යාලයෙ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

11–329

අංකය : ඊ. 23/කො. 251/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 2, රයිපල් විදියේ, අංක 21 හි, කේ. කුගදාස් මහතා හා කොළඹ 2, කිව් පාරේ, අංක 72 හි, ද කලම්බු කෝපරේටිව් ප්‍රින්ටර්ස් සොසයිටි ලිමිටඩ්, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ, අංක 282 හි යූ. එල්. එම්. ෆාරුක් මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 2 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

කොළඹ 2, රයිෆල් වීදියේ, අංක 21 හි,
කේ. කුගදාස් මහතා,

සහ

කොළඹ 2, කිව් පාරේ අංක 72 හි, ද කලම්බු කෝපරේටිව්
ප්‍රින්ටර්ස් සොසයිටි ලිමිටඩ්

අතර පවතින ආර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, කේ. කුගදාස් මහතා ද කලම්බු කෝපරේටිව් ප්‍රින්ටර්ස් සොසයිටි ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් ප්‍රධාන ගිණුම් ලිපිකරු තනතුරින් ශෝධ්‍යපත්‍ර කියවන්නෙකුගේ තනතුරට මාරු කිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට කවර සහනයන් හිමි විය යුතු ද යන්න වේ.

1970 ඔක්තෝබර් මස 25 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

11-385

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ණය අංක : 2740.

### ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව (402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1970 ජූලි 8 වෙනි දින සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කොටගත් බව මෙයින් නිවේදනය කරමි :—

" ප්‍රසිද්ධ නොතාරිස් නැන්පත් කොළඹ ඒ. ඇජ්. බී. ද ඩබ්ලිව්. තිලකරත්න මහතා විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 891 සහ 63.10.2 දින දරණ බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් ගම්පහ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ලේ වීගොඩ පදිංචි විජේසිංහ ලියනගේ පතිරන් නැහෙලාගේ වික්ටර් විජේසිංහ නමැති අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් හයදාස් අටසිය තිස්හයයි සත තිස්හයක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින් ද, එකී රු. 6,836.36ක මුදලත්, මුල් මුදලේ ශේෂය වන රු. 5,714.20 ට 70.7.1 දින සිට විකුණුම් දිනය දක්වා වූ කාලය සඳහා සියයට 6½ බැගින් අයවිය යුතු පොලියත්, එකී ආඥපනතේ 78 වගන්තිය ප්‍රකාර විකුණුම් වියදම් සහ අවිශේෂ ගාස්තුද අයකර ගැනීම සඳහා එකී ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. ඇෆ්. බී. ද ඩබ්ලිව්. තිලකරත්න මහතා විසින් සහතික කරන ලද අංක 891 සහ 63.10.2 දින දරණ

බැඳුම්කරය මගින් එකී සංස්ථාවට උකස් කර ඇත්තාවූ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරලේ, දාසිය පත්තුවේ, බලබෝව ගමේ පිහිටි මැල්කුන් වත්තෝ ලොට් ඇෆ්ප්පී දරණ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඇස්. පෙරේරා විසින් සකස් කරන ලද අංක 1457 සහ 1960.12.8 දින දරණ ප්ලෑන ප්‍රකාර අ. 5, රූ. 3, ප. 26 ක ප්‍රමාණයෙන් යුත් දේපල කොළඹ බලය ලත් වෙන්දේසිකාර කේ. ඊ. එඩ්මන්ඩ් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ 402 වැනි අධිකාරය වන) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව පිළිබඳ ආඥාපනතින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

ගි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1970 ඔක්තෝබර් 21 දින, කොළඹ 3,
ගාලු පාරේ අංක 292 දරණ ස්ථානයේදීය.

11-368

---

## දැන්වීමයි

### මහජනතාවගේ දැනගැනීම පිණිසයි

මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය මගින් පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරහා වේල්ලක් ඉදිකරන බැවින්, මහවැලි ගඟේ දකුණු ඉවුර දිගේ අලුත්ගන්තොට සිට ලේවැල්ල දෙසට වැටී ඇති මාවිල්බඩ පාර (ලේඩි හැව්ලොක් ඩ්‍රයිව්) නමින් හැඳින්වෙන මාර්ගයේ වටපුලුව නිවාස යෝජනා ක්‍රමයට විරුද්ධ පැත්තෙහි අඩි 600 ක් පමණ දුරක් රථවාහන සඳහා වසා දැමීමට සිදුවී තිබේ.

මෙම ස්ථානයේ සිට දකුණට සහ උතුරට ගමන් කරන හෝ මෙම ස්ථානය කරා පැමිණෙන රථවාහන වටපුලුව නිවාස යෝජනා ක්‍රමයේ ප්‍රධාන මාර්ගය හරහා ගමන් කල යුතුය.

එම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්,
මහනුවර නගර සභාව.

11-264

---

## කැප්පෙටිපොල දිසාව සැමරීම සඳහා විශේෂ මුද්දර නිකුත් කිරීම

කැප්පෙටිපොල දිසාව සැමරීම සඳහා 1970 නොවැම්බර් මස 26 වන දින, ශත 25 වටිනාකමින් යුත් විශේෂ මුද්දර නිකුත් කරනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම මුද්දර 1971 මැයි 31 වන දින තෙක් හෝ තොග අවසානය වන දිනය යන මේ දෙදිනෙන් කලින් එළඹෙන දිනය දක්වා අලෙවිය සඳහා තබනු ලැබේ. මෙම කාලය තුළදී දැනට අලෙවියෙහි පවත්නා කාණ්ඩයේ ශත 25 වටිනාකමින් යුත් මුද්දර අලෙවි කිරීම අත්හිටවනු ලැබේ.

2. ශත 25 වටිනාකමින් යුක්ත වූ මුද්දරය, කැප්පෙටිපොල දිසාවගේ පිළිරුවක් පිළිබිඹු කෙරේ.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

1970 නොවැම්බර් මස 5 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ.

11-392

---

## ප්‍රකාශනයයි

යාපනය දිස්ත්‍රික්කයේ පච්චිල පලෙයි ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් මුහමාලෙයි ප්‍රදේශයේ පිස්සු බලු උවදුර පවතින බැව් මට ඒත්තු ගොස් තිබෙන නිසා, එම මුහමාලෙයි ගම්සහා ප්‍රදේශයේ සීමාවට අයත් සියලුම ප්‍රදේශ පිස්සු බලු උවදුර පවතින හෝ පැතිරීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස මෙම ගැසට් නිවේදනය පළවූ දා සිට මාස 6 ක කාලයක් යනතුරු පිස්සු බලු ආඥාපනතේ (476) වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. ප්‍රකාශයට පත් කරන ලද යථෝක්ත ප්‍රදේශය තුළ, පුද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී පාරකදී හෝ වෙනයම් ස්ථානයකදී හමුවන, පටියකින් හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට ඉඩ තිබේ.

එම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ඔක්තෝබර් 15 දින,
දිසාපති කාර්යාලය,
යාපනය.

11-200

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | — | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | — | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.10 සිකුරාද | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | — | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | — | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | — | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | — | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | — | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි